සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

# 25A - ඉන්දීය ඉතිහාසය

## නව නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

## 25 A - ඉන්දීය ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

I පත්‍රය 01 x 40 = 40

II පත්‍රය

| | | |
|---|---|---|
| අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 18 |
| සෙසු ප්‍රශ්න 3කට 14 බැගින් | = | 42 |
| II පත්‍රය අවසාන ලකුණු | = | 60 |

අවසාන ලකුණු = 40 + 60 = 100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................
............................................................
............................................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................................
............................................................
............................................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................................
............................................................
............................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ඉන්දීය ඉතිහාසය II (I කොටස)
இந்திய வரலாறு II (பகுதி I)
History of India II (Part I)

25 A | S | II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**ඉන්දිය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**විභාග අංකය:** ................................

**උපදෙස්:**

※ මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
※ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
※ මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) භාරත් දේශ් (2) හින්දුස්ථාන් (3) භාරත වර්ෂ
(4) හිමවල් ප්‍රදේශ් (5) ජම්බුද්වීප (..4..)

**2.** (1) බැරෝඩා (2) සාවිස් (3) ඛයිබර්
(4) මක්‍රාන් (5) බෝලාන් (..2..)

**3.** (1) රූපාර් (2) භාරුකච්ඡ (3) චන්හුදාරෝ
(4) මොහෙන්ජොදාරෝ (5) රඛිගාර්හි (..2..)

**4.** (1) අනු (2) පුරු (3) යදු
(4) තුර්වාසු (5) පෞරව (..5..)

**5.** (1) වත්ස (2) ලිච්ඡවි (3) මල්ල
(4) ශාක්‍ය (5) කෝලිය (..1..)

**6.** (1) ශක (2) ඉන්දු-ග්‍රීක (3) කුෂාණ
(4) පාර්ථියන් (5) වාකාටක (..5..)

**7.** (1) සාරානාත් (2) ගිර්නාර් (3) නාසික්
(4) මස්කි (5) ෂබාෂ්ගර්හි (..3..)

**8.** (1) අමරාවතී (2) නාගර්ජුනිකොණ්ඩ (3) කෝනාරක්
(4) භාරුත් (5) සාංචි (..3..)

**9.** (1) තෙළිඟු (2) කන්නඩ (3) මලයාලම්
(4) මරාටි (5) දෙමළ (..4..)

**10.** (1) නාලන්දා (2) ජගද්දලා (3) හස්තිනාපුර
(4) ඕදන්තපුරි (5) වික්‍රමශිලා (..3..)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) හියුංසාං - චීන
(2) තාරානාත් - බෙංගාල
(3) අල්බිරූණි - පර්සියන්
(4) ටොලමි - ග්‍රීක
(5) ප්ලිනි - රෝම (..2..)

**12.** (1) අංග - වස්සකාර
(2) ගන්ධාර - පුක්කුසාති
(3) වත්ස - උදයන
(4) මගධ - අජාසත්ත
(5) කෝසල - පසේනදී (..1..)

**13.** (1) කුණාල - මෞර්ය
(2) බිම්බිසාර - හර්යංක
(3) වීම කැඩ්ෆයිසිස් - කුෂාණ
(4) මිනැන්ඩර් - ඉන්දු-ග්‍රීක
(5) මාරවර්මන් - සාතවාහන (..5..)

**14.** (1) දෙවන පුලකේශීන් - අයිහොලේ ශිලාලිපිය
(2) රුද්‍රදාමන් - ජූනාගාඩ් ශිලාලිපිය
(3) ස්කන්ධගුප්ත - භිටරි ශිලාලිපිය
(4) ගෞතමීපුත්‍ර බාලශ්‍රී - නිග්ලිසාගර් ශිලාලිපිය
(5) ඛාරවේල - හතිගුම්ඵා ශිලාලිපිය (..4..)

**15.** (1) පුරුෂපුරය - පෙෂාවෝර්
(2) සාගල - සියල්කෝට්
(3) ප්‍රයාග - ගුජරාට්
(4) ඉන්ද්‍රප්‍රස්ථ - දිල්ලිය
(5) සෞරාෂ්ට්‍ර - කතියවාර් (..3..)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ. Y** තීරය **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

| | X | | Y |
|---|---|---|---|
| **16.** (i) | රාවී | A | අයෝධ්‍යා |
| (ii) | සරයු | B | වාරාණසි |
| (iii) | යමුනා | C | අමරාවතී |
| (iv) | ගංගා | D | හරප්පා |
| (v) | ක්‍රිෂ්ණා | E | මථුරා |

(1) AEBCD (2) BCDEA (3) DAEBC (4) DEBCA (5) EBCDA (..3..)

| | X | | Y |
|---|---|---|---|
| **17.** (i) | භාගදුග | A | රජුගේ උපදේශක |
| (ii) | සේනානි | B | රථාචාර්ය |
| (iii) | පුරෝහිත | C | බදු එකතු කරන්නා |
| (iv) | සංග්‍රහිත්‍රී | D | භාණ්ඩාගාරික |
| (v) | සූත | E | සේනාපති |

(1) BDCEA (2) CEADB (3) CEDBA (4) DCEAB (5) EABDC (..2..)

| | X | | Y |
|---|---|---|---|
| **18.** (i) | චතුර් ආශ්‍රම | A | සාම, දාන, භේද, දණ්ඩ |
| (ii) | චතුර් වේද | B | බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර |
| (iii) | චතුර් සත්‍ය | C | බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්න්‍යාසී |
| (iv) | චතුර් වර්ණ | D | ඍග්, යජුර්, සාම, අථර්ව |
| (v) | චතුර් උපායමාර්ග | E | දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග |

(1) ABDCE (2) BCDEA (3) CADBE (4) CDEBA (5) DEBAC (..4..)

| | X | | Y |
|---|---|---|---|
| **19.** (i) | රාෂ්ට්‍ර | A | පවුල |
| (ii) | කුල | B | ශුද්ධ වූ පානයකි |
| (iii) | පුර් | C | පරිපාලන ඒකකයකි |
| (iv) | සෝම | D | කාසි වර්ගයකි |
| (v) | නිෂ්ක | E | නගරය |

(1) ADBCE (2) CAEBD (3) CDBAE (4) DBCAE (5) EABDC (..2..)

| | X | | Y |
|---|---|---|---|
| **20.** (i) | අජන්තා | A | පල්ලවරථ |
| (ii) | මථුරා | B | තාන්ත්‍රික බෞද්ධ ගුහා විහාර |
| (iii) | භුවනේශ්වර් | C | බුද්ධ ප්‍රතිමා |
| (iv) | මහබලිපුරම් | D | ලිංගරාජ දේවාලය |
| (v) | අවුරංගබාද් | E | බෞද්ධ බිතුසිතුවම් |

(1) ACBDE (2) ADEBC (3) CDEBA (4) EBCDA (5) ECDAB (..5..)

● අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. ඉන්දු නිම්න වැසියන්ගේ සමාජ දිවිපෙවෙත**

(1) මෙම ශිෂ්ටාචාරයට අයත් වැසියා කැල්කොලිතික සමාජයකට අයත්යැයි පිළිගනු ලැබේ.
(2) ඔවුහු තිරිඟු, බාර්ලි සහ වී වැනි ධාන්‍යවර්ග වගා කළහ.
(3) මෙහි වැසියෝ ඊජිප්තු වැසියන් සමඟ සමීප සබඳතා පැවැත් වූහ.
(4) මෙහි විසූ ස්ත්‍රීහු මාල, වළලු සහ මුදු වැනි ආභරණ භාවිත කළහ.
(5) ඔවුහු වෘක්‍ෂ වන්දනාව කළහ. (..3..)

**22. පශ්චාත් මෞර්ය සමයේ ඉන්දියානු විදේශ වෙළෙඳාම**

(1) බටහිර රටවල් සමඟ වාණිජ සම්බන්ධතා පැවැත්වීමේ දී භාරුකච්ඡ වරායට වැදගත් තැනක් හිමි විය.
(2) ඉන්දියානුවෝ රෝම අධිරාජ්‍ය සමඟ වෙළෙඳ සබඳතා පැවැත් වූහ.
(3) මේ අවධියේ දී වෙළෙන්දෝ ශ්‍රේණි වශයෙන් සංවිධානය වී සිටියහ.
(4) වෙළෙඳ ශ්‍රේණි මෙකල බැංකු ලෙස ද ක්‍රියාත්මක විය.
(5) සමුද්‍රගුප්ත රජු ඉන්දියානු වෙළෙඳුන් සඳහා පර්සියාවෙහි නේවාසික මධ්‍යස්ථානයක් ඉදිකළේ ය. (..5..)

**23. සාතවාහන රජ පෙළපත**

(1) ඩෙකානයේ පළමුවැනි අධිරාජ්‍ය පිහිටුවන ලද්දේ සාතවාහනයන් විසිනි.
(2) සාතවාහන රජපෙළපතේ ආරම්භකයා වූයේ සිමුකය.
(3) සාතවාහනයින් අනුග්‍රහය දක්වන ලද්දේ හින්දු ආගමට පමණි.
(4) සාතවාහනයන්ගේ අගනගරය ප්‍රතිෂ්ඨානය විය.
(5) ක්‍රිෂ්ණා-ගෝධාවරී නිම්නවල ඔවුන්ගේ ආධිපත්‍ය ස්ථාපිතව පැවතුණි. (..3..)

**24. දෙවන චන්ද්‍රගුප්ත රජු**

(1) ඔහු ස්කන්ධගුප්ත රජුගේ පුත්‍රයා ය.
(2) ගුජරාටය, සෞරාෂ්ට්‍රය සහ මාල්වා යටත්කර ගනිමින් ඔහු ගුප්ත අධිරාජ්‍යය පුළුල් කළේ ය.
(3) චීන සංචාරක භික්ෂුවක් වූ ෆාහියන් ඔහුගේ රාජ්‍ය සමයේ දී අවුරුදු කිහිපයක් ඉන්දියාවේ ගත කළේ ය.
(4) ඔහු තම දියණිය වූ ප්‍රභාවතී වාකාටක රාජ්‍යයේ දෙවන රුද්‍රසේන රජුට සරණපාවා දුන්නේ ය.
(5) ශිව භක්තිකයකු වුවද ඔහු බුද්ධාගමට හා ජෛනාගමට ඉඩදෙන ලදී. (..1..)

**25. පාල රාජවංශය**

(1) පාල රාජවංශයේ ආරම්භකයා ගෝපාල නම් ප්‍රාදේශීය නායකයෙකි.
(2) ධර්මපාල විසින් පාල රාජ්‍ය ව්‍යාප්ත කරන ලද අතර ඔහු ටික කලෙකට කනෞජය පාලනය කිරීමට ද සමත් විය.
(3) පාලවරුන් බුද්ධාගමට අනුග්‍රහය දැක්විය.
(4) නාලන්ද බෞද්ධ ආශ්‍රමය පිහිටුවන ලද්දේ පාල රජකු වූ ධර්මපාල විසිනි.
(5) නාලන්දා නඹපත පාල රජෙකු විසින් නිකුත් කරන ලදී. (..4..)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

  **(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ................................................ **1** ද
  **(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ................................................ **2** ද
  **(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ................................................ **3** ද
  **(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ................................................ **4** ද
  වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ................ **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26. ඍග් වෛදික යුගය**

(A) කුරු හා පංචාල මෙකල පැවති බලවත්ම ගෝත්‍ර විය.
(B) ඍග් වෛදික යුගයේ ජනයා දකුණු ඉන්දියාවේ පවා පදිංචිව සිටියහ.
(C) මෙම අවධියෙහි ජනයා ගෝත්‍ර සමූහයකට බෙදී සිටියහ.
(D) ස්වභාවධර්මය හා සම්බන්ධ දෙවිවරු පිරිසක් ඔවුහු ඇදහූහ. (..4..)

**27. ක්‍රි.පූ. 6 සියවසේ දී ඉන්දියාවේ පැවති සමූහාණ්ඩු**

(A) මෙකල සමූහාණ්ඩු දහසයක් පැවතිණි.
(B) ගණ හා සංඝ යන නම්වලින් එකල සමූහාණ්ඩු හඳුන්වා තිබේ.
(C) වජ්ජි හා ලිච්ඡවී යනු මෙකල පැවති වැදගත්ම සමූහාණ්ඩු දෙකකි.
(D) වයඹ දිග ඉන්දියාවේ පැවති එකම සමූහාණ්ඩුව මල්ල ජනපදයයි. (..3..)

**28. මෙගස්තිනිස් සහ ඉන්ඩිකා**

(A) මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා ග්‍රන්ථය ඉන්දියාවේ ආණ්ඩුක්‍රමය, භූගෝලීය තත්ත්වය, ආගම හා සමාජ තත්ත්වයන් පිළිබඳ තොරතුරු ලබාදෙන වැදගත් මූලාශ්‍රයකි.
(B) ඉන්ඩිකා ග්‍රන්ථයේ මුල් පිටපත හමුවී නැති අතර දැනට පවතින්නේ පසුකාලීන ලේඛකයන් විසින් මුල් ග්‍රන්ථයෙන් උපුටාගත් උධෘතයන් ය.
(C) මෙගස්තිනිස් මෞර්ය රාජසභාවේ සිටි මහා ඇලෙක්සැන්ඩර් විසින් එවන ලද තානාපතිවරයා ය.
(D) පාණ්ඩ්‍ය රාජ්‍යය පාලනය කරන ලද්දේ හින්දු පූජකයන් විසින් යයි මෙගස්තිනිස් වාර්තා කරයි. (..1..)

**29. රුද්‍රදාමන්**

(A) රුද්‍රදාමන් උජ්ජෙනිහි මහා ක්‍ෂත්‍රප විය.
(B) සුදර්ශන වැවේ බැම්ම කැඩී යාමත් පසුව එය නැවත ගොඩනැගීම ගැනත් ඔහුගේ එක් සෙල්ලිපියක දක්වා ඇත.
(C) රුද්‍රදාමන් උජ්ජෙනිහි ශක පාලනයේ ආරම්භකයා ය.
(D) ඔහු යුද්ධයෙන් පරදවාලීමට ගෞතමීපුත්‍ර සාතකර්ණි සමත් විය. (..1..)

**30. චාලුක්‍යයෝ**

(A) ක්‍රි.ව. 6 වන සහ 12 සියවස් අතර කාලය තුළ ඔව්හු දකුණු හා මධ්‍යම ඉන්දියාවේ විශාල ප්‍රදේශයක් පාලනය කිරීමට සමත් වූහ.
(B) ආරම්භයේ දී චාලුක්‍යයෝ පාලනය කළේ බදාමි සිට ය.
(C) නැගෙනහිර චාලුක්‍යයන් පාලනය ගෙනගියේ වෙංගි සිට ය.
(D) බටහිර චාලුක්‍යයන් තම අගනුවර ලෙස තෝරා ගත්තේ කල්‍යාණියයි. (..5..)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31. ශකවරු ඉන්දියාවට පැමිණියේ කුමන දුර්ග මාර්ගය හරහා ද?**

(1) ඛයිබර් දුර්ගය (2) බෝලාන් දුර්ගය (3) මක්රාන් දුර්ගය
(4) හේරාට් දුර්ගය (5) බැරෝඩා දුර්ගය (...2..)

**32. විෂ්ණු ශර්ම පඬිවරයා විසින් රචනා කරන ලදැයි සැලකෙන ඉන්දියානු උපදේශාත්මක ග්‍රන්ථය කුමක් ද?**

(1) රාජතරංගිනී (2) රාමායන (3) දිව්‍යාවදාන
(4) ශාකුන්තල (5) පංචතන්ත්‍රය (...5..)

**33. සාංචි ස්තූපය ඉදිකරන ලද්දේ කුමන රාජ්‍ය කාලයේ දී ද?**

(1) චන්ද්‍රගුප්ත මෞර්ය (2) අශෝක (3) පුෂ්‍යමිත්‍ර සුංග
(4) කණිෂ්ක (5) හර්ෂවර්ධන (...2..)

**34. සංචාරක චීන භික්ෂුවක් වූ හියුං සාං අධ්‍යාපනය ලැබුවේ කුමන බෞද්ධ අධ්‍යාපන ආයතනයේ ද?**

(1) නාලන්දා (2) වලභි (3) ජගද්දලා
(4) ඕදන්තපූරි (5) තක්ෂිලා (...1..)

**35. ක්‍රි.ව. 712 දී සින්ධ් හා පංජාබ් ආක්‍රමණය කළ අරාබි ජාතිකයා කවුරුන් ද?**

(1) කුටුබ් උද්දීන් අයිබෙක් (2) මලික් කපූර් (3) ෂිහාබ් උද්දීන්
(4) ගස්නි මහමුද් (5) මොහොමද් බින් ක්වාසිම් (...5..)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා, ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ක්‍රි.පූ. හතරවන සහශ්‍රයේ සිටම පැවතියේ ය. | මෙම ශිෂ්ටාචාරයට අයත් ගොඩනැගිලි ඉදිකොට ඇත්තේ ගඩොලිනි. | (..4..) |
| **37.** | කුරු - පාණ්ඩවයන් අතර සිදු වූ යුද්ධය මහාභාරතයෙන් විස්තර කෙරේ. | එම සටන සිදු වී ඇත්තේ කුරුක්ෂෙත්‍රයේ ය. | (..2..) |
| **38.** | වර්ධමාන මහාවීර ජෛනයන්ගේ පළමුවන තීර්ථන්කරය. | මහාවීර කර්මය විශ්වාස නොකළේ ය. | (..3..) |
| **39.** | බුද්ධ ප්‍රතිමාව මුල්වරට නිමකොට තිබෙන්නේ කුෂාණ සමයේ දී ය. | කුජුල කැඩ්ෆයිසීස් මුල්වරට රන්කාසිවල බුද්ධ රූපය කැටයමට නගා ඇත. | (..1..) |
| **40.** | විවිධ බෞද්ධ නිකායන් අතර පැවැති මතභේද නිරාකරණයට තුන්වන ධර්ම සංගායනාව කැඳවනු ලැබී ය. | සංගායනාව අවසානයේ දී ථෙරවාදයට එරෙහි වූ භික්ෂූන් සසුනින් පළවා හැරිණි. | (..2..) |

❋ ❋

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020

### නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்

| විෂය අංකය பாட இலக்கம் | 25 A | විෂයය பாடம் | ඉන්දීය ඉතිහාසය |
|---|---|---|---|

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 3 | 31. | 2 |
| 02. | 2 | 12. | 1 | 22. | 5 | 32. | 5 |
| 03. | 2 | 13. | 5 | 23. | 3 | 33. | 2 |
| 04. | 5 | 14. | 4 | 24. | 1 | 34. | 1 |
| 05. | 1 | 15. | 3 | 25. | 4 | 35. | 5 |
| 06. | 5 | 16. | 3 | 26. | 4 | 36. | 4 |
| 07. | 3 | 17. | 2 | 27. | 3 | 37. | 2 |
| 08. | 3 | 18. | 4 | 28. | 1 | 38. | 3 |
| 09. | 4 | 19. | 2 | 29. | 1 | 39. | 1 |
| 10. | 3 | 20. | 5 | 30. | 5 | 40. | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ඉන්දීය ඉතිහාසය II (II කොටස)
இந்திய வரலாறு II (பகுதி II)
History of India II (Part II)

25 A | S | II

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

උපදෙස්:
* පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නයටත්, B හා C කොටස්වලින් එක ප්‍රශ්නය බැගින් තෝරා ගෙන තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(පළමුවැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) මොහෙන්ජොදාරෝ (ii) ආරවල්ලි කඳු
(iii) ඉන්ද්‍රප්‍රස්ථ (iv) ලෝතාල්
(v) ඛයිබර් දුර්ගය (vi) භාරුකච්ඡ
(vii) සාංචි (viii) පාටලිපුත්‍ර
(ix) පුරුෂපුර (x) කනෞජ්
(xi) තානා (xii) කාවේරි නදිය

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)*

## B කොටස

**2.** ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිළිබඳව පහත දැක්වෙන මාතෘකා යටතේ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

(i) ශිෂ්ටාචාරයේ ආරම්භය
(ii) ශිෂ්ටාචාරයේ ප්‍රධාන නාගරික ලක්ෂණ
(iii) ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳ වැටීම (ලකුණු 16යි.)

**3.** ඍග් වෛදික යුගයේ සමාජ - ආර්ථික හා සංස්කෘතික තත්ත්වයන්හි ප්‍රධාන ලක්ෂණ විග්‍රහ කරන්න. (ලකුණු 16යි.)

**4.** "චන්ද්‍රගුප්ත මෞර්ය ප්‍රථමවරට ඉන්දියාව එක්සේසත් කිරීමට සමත් විය."

(i) චන්ද්‍රගුප්ත මෞර්යට පෙර මගධය පාලනය කළ රජ පෙළපත නම් කරන්න. (ලකුණු 01යි.)
(ii) චන්ද්‍රගුප්ත මෞර්යගේ අනුප්‍රාප්තික පාලකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි.)
(iii) චන්ද්‍රගුප්ත මෞර්ය සිහසුනට පත්වීමට පෙර ඉන්දියාවේ දේශපාලන තත්ත්වය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 04යි.)
(iv) චන්ද්‍රගුප්ත මෞර්ය ඉන්දියාව එක්සේසත් කළ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 09යි.)

**5.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) සංගම් සාහිත්‍යය
(ii) ක්‍රි.පූ. 6 සියවසේ දී ඉන්දියාවේ පැවති රාජාණ්ඩු
(iii) මෞර්ය සහ ගුප්ත අධිරාජ්‍ය සමයන් අතර කාලයෙහි වයඹදිග ඉන්දියාවට එල්ල වූ විදේශීය ආක්‍රමණ
(iv) කුෂාණ යුගයේ සංස්කෘතිය (ලකුණු 08 × 2 = 16යි.)

## C කොටස

**6.** "සමුද්‍රගුප්ත යුද මෙහෙයුම් කරුවෙකි"

(i) සමුද්‍රගුප්තගේ කාර්ය සාඵල්‍ය ගැන තොරතුරු ලබාදෙන ප්‍රධාන මූලාශ්‍රය නම් කරන්න. (ලකුණු 01යි.)

(ii) සමුද්‍රගුප්තට පූර්වයෙහි සිටි ගුප්ත පාලකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි.)

(iii) සමුද්‍රගුප්ත රජවන විට ගුප්ත බලය පැතිරී තිබුණු ආකාරය පිළිබඳව කෙටි විස්තරයක් සපයන්න. (ලකුණු 03යි.)

(iv) සමුද්‍රගුප්තගේ ව්‍යාප්තවාදී ප්‍රතිපත්තිය ඇසුරින් ඔහු කෙතෙක් දුරට යුදකාමියකු ලෙස සැලකිය හැකිදැයි පරීක්‍ෂා කරන්න. (ලකුණු 10යි.)

**7.** හර්ෂවර්ධනගේ මරණයෙන් පසු උතුරු ඉන්දියාවේ ආධිපත්‍ය උදෙසා පැවති අරගලය පරීක්‍ෂා කරන්න. (ලකුණු 16යි.)

**8.** දකුණු ඉන්දියානු දේශපාලනයෙහිලා චෝළයන්ගේ දායකත්වය පහත දැක්වෙන ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.

(i) අධිරාජ්‍ය ව්‍යාප්තිය

(ii) ප්‍රාදේශීය හා ග්‍රාමීය පරිපාලනය (ලකුණු 16යි.)

**9.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ගුප්ත පාලකයන් යටතේ සාහිත්‍යය

(ii) හූණ ආක්‍රමණ

(iii) හර්ෂවර්ධන රජු

(iv) පාණ්ඩ්‍ය රාජධානිය (ලකුණු 08 × 2 = 16යි.)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

NEW


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | |
|---|---|---|
| ඉන්දීය ඉතිහාසය II<br>இந்திய வரலாறு II<br>History of India II | 25A | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. } 1

විභාග අංකය / சுட்டெண் / Index No. } ..............................



**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020 - නව නිර්දේශය**

**ඉතිහාසය II (II කොටස)**

**ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**උපදෙස්:**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නයටත්, B හා C කොටස්වලින් එක ප්‍රශ්නය බැගින් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**
  **(පළමුවැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.)**

## A කොටස

**1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | |
|---|---|
| (i) මොහෙන්ජොදාරෝ | (ii) ආරවල්ලි කඳු |
| (iii) ඉන්ද්‍රප්‍රස්ථ | (iv) ලෝතාල් |
| (v) ඛයිබර් දුර්ගය | (vi) භාරුකච්ච |
| (vii) සාංචි | (viii) පාඨලීපුත්‍ර |
| (ix) පුරුෂපුරය | (x) කනෞජය |
| (xi) තානා | (xii) කාවේරි නදිය |

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)*

## B කොටස

**2. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිළිබඳව පහත දැක්වෙන මාතෘකා යටතේ විචාරාත්මක විග්‍රහයක් කරන්න.**

**(i) ශිෂ්ටාචාරයේ ආරම්භය**

- ශිෂ්ටාචාරයේ ආරම්භය කෙසේ සිදුවිද්දැයි නිගමනයකට බැසීමට තරම් සාධක නැත.
- දැනට මේ සම්බන්ධයෙන් ප්‍රධාන මත දෙකක් ඉදිරිපත්වී තිබේ.
  1. දේශීය ප්‍රභවයකින් ආරම්භ වූ බව
  2. විදේශීය ප්‍රභවයකින් ආරම්භ වූ බව

**දේශීය ප්‍රභවය**

- මේ මතය ඉදිරිපත් කළ අය අතරින් ග්ලීනි ඩැනියෙල් සහ ඒ. සෝෂ් ප්‍රධාන වේ.
    - ගුජරාට්, රාජස්ථාන්, සින්ද්, පංජාබ් හා බලුකිස්ථාන්වැනි ප්‍රදේශවල කරන ලද ගවේශණවලට අනුව සියලු ස්ථරවල සජාතීය තත්ත්වයක් දක්නට ලැබෙන බැවින් ඉන්දු නිම්න ශිෂ්ටාචාරය දේශීය ආරම්භයක් ඇති ශිෂ්ටාචාරයක් බව.
    - මේ හැර වෙනත් ප්‍රදේශවල සිදුකළ කැණීම්වලින් විශේෂයෙන් කලිබන්ගන්, සන්දනවාලා, දබර්කෝට්, චන්හුදාරෝ, ලෝතාල්, කොත්දිජි, ජුඩෙයිජොදාරෝ, ආම්රි, සුක්තජෙන්දෝර්, රොප්දි හා දේසල්වාර් යන නගරවලින්, මොහෙන්ජොදාරෝ, හරප්පා නගර නිර්මාණවලට සමාන වූ නටබුන් හා හරප්පා යුගයට පෙර පැවති සංස්කෘතියට අයත් නටබුන් ද හමුවේ.
    - කලිබංගන්හි එකම නිවසක තිබී ප්‍රාග් හරප්පා හා හරප්පා යුගවලට අයත් මැටි බඳුන් ලැබී තිබීම.
    - ඒ අනුව පූර්ව හරප්පා ග්‍රාමීය සංස්කෘතිය අනුක්‍රමයෙන් අභාවයට යද්දී, ඒ මත ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ආරම්භ වූ බව.

**විදේශීය ප්‍රභවය**

මේ මතය දැරූ ප්‍රධාන විද්වතුන් වන්නේ මෝටිමර් වීලර්, එලියට් ස්මිත් හා රෙග්ලන් සාමි ය.

- **මෝටිමර් වීලර්,**
    - මෙසපොතේමියානු ශිෂ්ටාචාරය ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භයට සම්බන්ධ බව.
    - නාගරික ශිෂ්ටාචාරයක දැනුමක් තිබූ සංචාරක ගෝත්‍රයක් ඉරාණ සානුව හරහා ඉන්දු නිම්න මිටියාවතට පැමිණීම නිසා එහි නාගරික සභ්‍යත්වය ආරම්භයට පදනම වැටුණු බව.
    - මෙසපොතේමියානු ශිෂ්ටාචාරය ව්‍යාප්තව පැවති ප්‍රදේශවලින් ඉන්දු නිම්න මුද්‍රා හමුවීම.
- **එලියට් ස්මිත්**
    - මිසර ශිෂ්ටාචාරයෙන් පැන නැගී ආ ශිෂ්ටාචාරයක් බව.
- **රෙග්ලන් සාමිවරයා**
    - සුමේරියානු ශිෂ්ටාචාරයෙන් පැන නැගී ආ ශාඛා ශිෂ්ටාචාරයක් බව.

**(ii) ශිෂ්ටාචාරයේ ප්‍රධාන නාගරික ලක්ෂණ**

- පූර්ව සැලැස්මකට අනුව උපයෝගිතාව මුල් කොට ගනිමින් ගොඩනැගීම.
- සෑම නගරයකම වාගේ පොදු සමානතාවයකින් යුතුව නගර සැලැස්ම සකස් කොට තිබීම.
- නගරය වටා මුර අට්ටාල සහිත ප්‍රාකාරය ඉදිකර තිබීම. බලකොටු ස්වරූපයක් දැකිය හැකිවීම.
- ඇතුල් නුවර හා පිටි නුවර ලෙස කොටස් දෙකකින් සමන්විත වීම.
- ඇතුල් නුවර උස් වේදිකාවක් මත ඉදිකර තිබීම. පරිපාලන මධ්‍යස්ථානය ලෙස භාවිතා කිරීම.
- මහල් සහිත ගොඩනැගිලි නිර්මාණය කිරීම හා ඒවාට අවශ්‍ය නාන කාමර ඇතුලු වෙනත් පහසුකම් තිබීම. විවෘත මැද මිදුලක් දක්නට තිබීම.
- ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රධාන වශයෙන් ගඩොල් භාවිතා කිරීම. (පිලිස්සූ හා හිරු එලියෙන් වේලා ගත්)
- ආයතාකාර සැලැස්මකට අනුව නගර ඉදිකිරීම.

- විශාල නගර තුළ පුළුල් මංමාවත් සකස් කර තිබීම.
- ප්‍රධාන මාවත්වලට දෙපසින් විහිදී ගිය කාණු පද්ධතියක් ඉදිකර තිබීම.
- වීථි නිර්මාණය ඍජු කෝණාශ්‍රාකාර අයුරින් සිදු කර තිබීම.
- මනා ජලප්‍රවාහන හා මළ ප්‍රවාහන පද්ධතියක් සකස් කර තිබීම.
- සෞඛ්‍ය සම්පන්න බවට මුල් තැන දෙමින් නගර සැලැසුම් කිරීම.
- නිවාස පද්ධතිය, ඇතුළු නගරය, මොහෙන්ජොදාරෝවේ ස්නානාගාරය, හරප්පාවේ ධාන්‍යාගාරය, ආලෝක කුලුණු, රබිගාර්හි විශාල ස්නානාගාරය වැනි අංශවලින් නාගරික ලක්ෂණ පෙන්නුම් කිරීම.
- සමාජ ස්ථරායනයක් පැවති බව. (නාගරික ප්‍රභූ පන්තිය, සුඛෝපභෝගී ජීවිත ගත කරන නාගරික ජනතාව, ධනවත් වෙළෙඳ පන්තිය, කම්කරු පන්තිය)
- දේශීය හා විදේශීය වෙළෙඳාමක් පැවතීම.
- මොහෙන්ජොදාරෝ, හරප්පා මෙන් මෑතක සොයා ගත් රබිගාර් තුළින් ද නාගරික ලක්ෂණ පෙන්නුම් කරයි.

**(iii) ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳ වැටීම**

බිඳවැටීම සම්බන්ධව මත කීපයක් දක්නට ලැබේ.

- ක්‍රමික පරිහානියක් සිදු වූ බව
    - ජනගහනය වර්ධනය වීමත් සමඟ ජීවන තත්ත්වය පහත වැටීම, පාලනය දුර්වල වීම නිසා ශිෂ්ටාචාරය ක්‍රම ක්‍රමයෙන් පරිහානියට පත් වූ බව.
- ජලගැලීම් නිසා බිඳවැටුණු බව.
    - ඒ. වී. ෂර්මා, මෝටිමර් වීලර් සහ ජෝන් මාෂල් මේ අදහස දැරූ අය අතර වේ.
    - ඉන්දු නදිය නිරන්තර පිටාර ගැලීම ශිෂ්ටාචාරය පරිහානි අවස්ථාව වන විට ඔරොත්තු නොදීම ශිෂ්ටාචාරයේ බිඳවැටීමට හේතු වූ බව.
    - ඉන්දු නදිය දෙපස විශාල ප්‍රාකාර තනා තිබූ බවට සාධක තිබීම.
    - ස්ථර අතර රොන්මඩ තැන්පත්ව තිබීම හා රාවී ගංගාවේ ගමන් මාර්ගය වෙනස්වීම නිරන්තර ජල ගැලීම්වලට මුහුණ පෑ බවට ඇති සාධක අතර වේ.
- හදිසි ගින්නකින් ශිෂ්ටාචාරය බිඳ වැටුණු බව.
    - ගොඩනැගිලි නටබුන්වල ඇතැම් ගොඩනැගිලි ගින්නකින් විනාශ වූ බවට සාධක දක්නට ලැබීම.
- දේශගුණික වෙනස්වීම්.
    - දියුණු ශිෂ්ටාචාරයක පරිහරණය සඳහා දව භාවිතය අධිකව සිදුවීම. ගඩොල් පිළිස්සීම සඳහා දව භාවිතා කිරීම ආදිය නිසා වන විනාශය සිදුවීම පරිසරයේ සමතුළිත බව වෙනස්වීම හා ගංගාවල ගමන් මාර්ග වෙනස්වීම ආදිය නිසා දේශගුණික විපර්යාසයක් ඇතිවීම.

- ➢ වසංගත රෝග පැතිරීම.
    - පරිසරයේ වෙනස්වීම් ආදිය නිසාත් ජලගැලීම් නිසාත් වසංගත රෝග පැතිර යාම නිසා මේ ප්‍රදේශ අත්හැර යාමට පෙළඹෙන්නට ඇති බව.
- ➢ සතුරු ආක්‍රමණයකින් විනාශ වූ බව.
    - ප්‍රහාරයකින් මිය ගිය බව සැලකිය හැකි පුද්ගලයන්ගේ ඇටසැකිලි හමුවීම. නිවෙස් තුළ, මාර්ගවල, ඇතුළු ස්ථාන කීපයකින්ම කැපුම් කෙටුම්වලට ලක් වූවන්ගේ ඇටසැකිලි හමුවීම.

***(ලකුණු 16යි)***

**3. ඍග් වෛදික යුගයේ සමාජ - ආර්ථික හා සංස්කෘතික තත්ත්වයන්හි ප්‍රධාන ලක්ෂණ විග්‍රහ කරන්න.**

- ➢ **සමාජය තත්ත්වය**
    - ඍග් වේදයෙන් තොරතුරු හඳුනා ගැනීම.
    - ගෝත්‍රවලින් යුත් සමාජයක් පැවතීම (පුරු, යදු, තුර්වාස, අනු)
    - පීතෘමූලික සමාජයක් වීම.
    - පුළුල් අයුරින් සිරිත් විරිත් ආරක්ෂා කිරීම.
    - ආගන්තුක සත්කාරය උසස්තම ගුණාංගයකි.
    - නිවාස දැව, උණලී, ආදියෙන් තනා පිදුරු සෙවිලි කොට තිබිණි.
    - යාඥා කාමරය, ස්ත්‍රී කාමරය, පොදු කටයුතු සඳහා කාමරය, ගිනිහල් ගෙය යන අංශ හතරකින් නිවාස සමන්විත විය.
    - ඒක විවාහ ක්‍රමය පැවතිණි.
    - විවාහ මංගල්‍ය උත්සවය මහත් ගරුසරු එකක් සේ සැලකුණි.
    - පිරිමි දරුවන් ලැබීම විවාහයේ ප්‍රධානම පරමාර්ථය විය.
    - කාන්තාවන්ට නිදහස හිමිව තිබීම.
    - භාර්යාව ස්වාමියා සමඟ පූජාවන්ට සහභාගි වී ඇත.
    - අධ්‍යාපනය ලැබූ කාන්තාවන් සිටීම (විශ්වවාරා, ආපාලා, ඝෝෂා)
    - වර්ණ භේදය පැවතුන ද එය සමාජයේ තහවුරුවී නොතිබීම.
    - ආර්ය අනාර්ය භේදය පැවතිණි.
    - ඇඳුම් භාවිතා කෙරිණි.
    - මේ අවධියේදී ඇඳුම කොටස් හතරකින් යුක්ත ය. (නිවි - යටිකය ඇඳුම, වාස - උඩුකය ඇඳුම, අධිවාස - උතුරු සළුව, හිස්වැසුම)
    - පිරිමි හිස් ආවරණය කර ඇත.
    - ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම ආභරණ පැළඳිය.
    - ප්‍රධාන ආහාර වූයේ ධාන්‍ය වර්ග, මාංශ, මාළු, කිරි, කිරිවලින් සෑදූ ආහාර හා පළතුරුය.
    - සුරාව පැවති අතර සෝම පානය කර ඇත.
    - උත්සව අවස්ථාවලදී නැටුම් ගැයුම් පැවතිණි.
    - සමාජ ජීවිතයේ කේන්ද්‍රය වූයේ "සභා" ය.
    - රථ ධාවනය, දඩයම, දාදු ක්‍රීඩාව ඔවුන්ගේ විනෝදාංශ විය.
    - විවිධ ස්වභාවික වස්තූන් වන්දනා කිරීම.

➢ **ආර්ථික තත්ත්වය**
- කෘෂිකර්මාන්තය පදනම් කර ගත් ආර්ථික රටාවක් පැවතීම (යව, තිරිඟු, මෙනේරි, බාර්ලි වැනි ධාන්‍ය වගා කිරීම)
- සත්ව පාලනය ද වැදගත් අංශයක්වීම (ගවයා, එළුවා, බැටළුවා, අශ්වයා ප්‍රධාන විය)
- වෙළෙඳාම පැවතිණි.
- ගම් මට්ටමින්, ගොඩබිම් මාර්ග හා ගංගා ඔස්සේ භාණ්ඩ හුවමාරුව සිදුවී තිබේ.
- ගව සම්පත ආර්ථිකයේ මිනුම් ඒකකය විය.
- එළදෙන ශුද්ධ වස්තුවකි.
- ජලය ලබා ගැනීම සඳහා වාරික්‍රම භාවිතා කළේය.
- විවිධ කර්මාන්ත පැවතිණි. (රෙදි විවීම, වඩු කර්මාන්තය, හම් කරුවෝ, රන් කරුවන්, ලෝහ කර්මාන්තය)

➢ **සංස්කෘතික තත්ත්වය**
- බහුදේවවාදී ආගමික සංකල්පය පැවතීම.
- එහිදී ස්වභාවික වස්තු දේවත්වයෙහිලා පුදනු ලැබූ අතර දිව්‍ය ලෝකය, අන්තරීක්ෂය හා පෘථිවිය යන ස්ථානවල සංඛ්‍යාවෙන් විශාල ප්‍රමාණයක් දෙවියන් සිටින බව විශ්වාස කිරීම.
- ඒ දෙවිවරු අතර ඉන්ද්‍ර, වරුණ, මාරුත්, අග්නි, සාවිත්‍රි, මිත්‍ර, උෂස් හා වායු වැනි දෙවිවරු කැපී පෙණුනි.
- සරල යාග විධි පැවතිණි.
- මෙකල ප්‍රධාන යාග ක්‍රම දෙකක් පැවතිණි (ගෘහ කර්මානි, මහායාග)

*(ලකුණු 16යි)*

4. **"චන්ද්‍රගුප්ත මෞර්ය ප්‍රථමවරට ඉන්දියාව එක්සේසත් කිරීමට සමත් විය."**

   (i) **චන්ද්‍රගුප්ත මෞර්යට පෙර මගධය පාලනය කළ රජ පෙළපත නම් කරන්න.**

   නන්ද රජ පෙළපත

   *(ලකුණු 01යි)*

   (ii) **චන්ද්‍රගුප්ත මෞර්යගේ අනුප්‍රාප්තික පාලකයන් දෙදෙනකු නම් කරන්න.**

   බින්දුසාර, අශෝක, බෘහද්රථ, කුණාල, ජලෞක, වීරසේන, දශරථ

   *(ලකුණු 02යි)*

**(iii) චන්ද්‍රගුප්ත මෞර්ය සිහසුනට පත්වීමට පෙර ඉන්දියාවේ දේශපාලන තත්ත්වය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.**

- ක්‍රි. පූ. හයවැනි සියවසේදී හර්යංක පෙළපතට අයත් සේනිය බිම්බිසාර රජු යටතේ මගධයේ නැගීම ඇරඹේ.
- හර්යංක පෙළපතට පසු මගධයේ පාලකයන් වන්නේ සිසුනාග පරපුරයි.
- සිසුනාග හා ඔහුගේ අනුප්‍රාප්තිකයෝ සියවසක් පමණ කාලයක් මගධය පාලනය කළහ.
- සිසුනාග වංශයෙන් බලය පැහැර ගැනීමට නන්දවරු සමත් විය.
- මෙලෙස බලය අල්ලා ගත් නන්ද රාජවංශයේ පළමු පාලකයා මහාපද්මනන්ද ය.
- මහාපද්මනන්ද රජු බෞද්ධ සාහිත්‍යයේ උග්ගසේන නන්ද ලෙස හඳුන්වා ඇත.
- මහාපද්මනන්ද පංචාල, කාසි, හෛහය, කාලිංග, අශ්මක, කුරු, ඉක්ෂ්වාක, මෛථිර, සූරසේන, විතිහෝත්‍ර යන වංශ යටත් කරගෙන මගධයට ඈඳාගත් බව පුරාණ ග්‍රන්ථවල සඳහන් වේ.
- මහාපද්ම නන්ද යටතේ මගධයේ බලය වින්ධ්‍යා පර්වතයෙන් දකුණු දිග ප්‍රදේශ කරා ද ව්‍යාප්ත වූ බවට තොරතුරු ඇත. ඛාරවේලගේ හථීගුම්පා ලිපියේ සඳහන් වන කාලිංගයේ වාරි කර්මාන්තයක් කර වූ මගධ පාලකයා මහා පද්මනන්ද ලෙස සැළකේ.
- ක්‍රි. පූ. 327 ඇලෙක්සැන්ඩර් වයඹදිග ඉන්දියාව ආක්‍රමණය කරන විට නැගෙනහිර ඉන්දියාවේ නන්දයන් යටතේ ප්‍රබල අධිරාජයක් ගොඩනැගී තිබිණි.
- ඒ වන විට නන්ද පෙළපතේ අවසාන පාලකයා වූ ධනනන්ද බලවත් සේනාවකින් සන්නද්ධවීම නිසා ග්‍රීක ආක්‍රමණිකයන්ට රට අභ්‍යන්තරයට පිවිසීමට නොහැකි විය.
- ධනනන්ද යටතේ ප්‍රබල හමුදාවක් සිටි බව ග්‍රීක වාර්තාවල සඳහන් වේ. ඒ අනුව පාබල හමුදාව ලක්‍ෂ දෙකක් ඇත් හමුදාව 3000ක් අස් හමුදාව 20000ක් රථ හමුදාව 2000 ඔහු සතුව තිබී ඇත.
- ධනනන්ද රජු ජනතාවගෙන් අසාධාරණ ලෙස අධික බදු අය කළ අතර ධනය රැස් කර තබා ගැනීමට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.
- චන්ද්‍රගුප්ත මෞර්ය මගධයේ බලය අත්පත් කර ගැනීමෙන් නන්ද පෙළපතේ බලය අවසන් විය.

***(ලකුණු 04 යි)***

**(iv) චන්ද්‍රගුප්ත මෞර්ය ඉන්දියාව එක්සෙසත් කළ ආකාරය පැහැදිලි කරන්න.**

- මෞර්ය අධිරාජයේ ආරම්භකයා හා ඉන්දීය ඉතිහාසයේ ප්‍රථම අධිරාජයා වීම.
- චානක්‍ය (කෞටිල්‍ය) බ්‍රාහ්මණයාගේ සහයෙන් නන්ද පෙළපත බලයෙන් පහ කිරීම.
- වයඹදිග ඉන්දියාව ග්‍රීක බලයෙන් මුදවා ගැනීම.
- සෙලියුකස් නිකේටර් සමඟ සටනක් සිදුවීම හා දෙදෙනා අතර ගිවිසුමක් ඇතිවීම.
- ගිවිසුමෙන් ග්‍රීකයන් සතුව පැවති ඒරියා (හිරාත්), ඇරකෝෂියා (කන්දහාර්), පරෝපනිසදයි (බලුකිස්ථානය), ගෙඩ්රෝසියා (කාබුල්) යන ප්‍රදේශ හිමිවීම.
- තව ද පුහුණු කරන ලද ඇතුන් 500 ලැබීම, මෙගස්තිනීස් තානාපතියෙකු ලෙස රාජසභාවට එවීම, සෙලියුකස් නිකේටර්ගේ දියණිය චන්ද්‍රගුප්ත මෞර්යට විවාහ කරදීම.
- අධිරාජ්‍යයේ බලය ඩෙකෑන් ප්‍රදේශය හා දකුණ දක්වා ව්‍යාප්තවීම.
- ඔහුගේ රාජ්‍යයට බටහිරින් පිහිටි කතියවාර්හි සුරාට් දේශය පවා අයිති වූ බව රුද්‍රදාමන්ගේ ජුනගාද් ලිපියෙන් සනාථ වේ. එහි පාලකයා බවට පත්වීම හා සුදර්ශන වැව ප්‍රතිසංස්කරණය කිරීම.
- විදේශ සබඳතා පැවැත්වීම (සිරියාව, ඊජිප්තුව)
- ගොඩබිම හා මුහුදු මාර්ග ඔස්සේ වෙළෙඳාම පවත්වා තිබීම.
- කෘෂිකර්මාන්තය දියුණු කිරීමට කටයුතු කිරීම.

- මනා පරිපාලන සංවිධානයක් ඇති කිරීම.
- පාඨලීපුත්‍රය අගනගරය බවට පත් කර ගැනීම.
- චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ අවසන් කාලයේදී මයිසෝරය සමඟ සබඳතා පැවැත්වීම හා මයිසෝරයේ ශ්‍රවණබෙල්ගෝලාවේ තවුස් දිවියක් (ජෛන සාදුවරයෙකු) ගතකිරීම.
- ඉන්දියාවේ ප්‍රථම, විශාලම අධිරාජ්‍යය ගොඩනැගීමේ ගෞරවය චන්ද්‍රගුප්ත මෞර්යට හිමිවේ.

***(ලකුණු 09යි.)***

**5. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.**

**(i) සංගම් සාහිත්‍යය**

- ක්‍රි. ව. පළමුවන සියවසේ සිට ක්‍රි. ව. තුන්වන සියවස දක්වා කාල පරිච්ඡේදය තුළ පාණ්ඩ්‍ය රජවරුන්ගේ අනුග්‍රහයෙන් ඒකරාශී වූ සංගම් මගින් රචිත සාහිත්‍ය සංගම් සාහිත්‍ය වේ.
- එවැනි සංගම් තුනක් පවත්වා තිබේ.
- පළමුවන සංගමය මධුරාවේ දකුණෙහි ද, දෙවැන්න කබාඩපුරම්හි ද, තුන්වැන්න මධුරාවේ ද පවත්වා ඇත.
- සංගම් සාහිත්‍යය උපදේශාත්මක හා වෘත්තාන්තමය යනුවෙන් දෙවර්ගයකි. උපදේශාත්මක කාව්‍ය කීල්කනක්කු යන නමින් ද වෘත්තාන්තමය ග්‍රන්ථ මේල්කනක්කු යන නමින් ද හඳුන්වා ඇත.
- පළමුවන සංගමයට අයත් ග්‍රන්ථ සොයා ගැනීමට නොමැත.
- දැනට විද්‍යමාන වන පළමු කෘතිය වන්නේ දෙවන සංගමයේදී රචිත තෝල්කාප්පියම් නැමැති ව්‍යාකරණ ග්‍රන්ථයයි.
- තුන්වන සංගමයේදී රචිත ප්‍රධාන ග්‍රන්ථ දෙකකි.
- සංහිතා (ඛාණ්ඩ) අටකින් සමන්විත වූ එට්ටුත්තොගයි හා ගීත (ඛාණ්ඩ) දහයකින් සමන්විත වූ පත්තුප්පාට්ටු ය.
- එට්ටුත්තොගයි (අගනානූරු, පුරනානූරු, නට්රිණයිනානූරු, කුරුන්තෝගයිනානූරු, අයිංගුරුනූරු, පදිට්ටුප්පත්තු, පරිපාඩල්, කලිත්තොගයි)
- පත්තුප්පාට්ටු (තිරුමුරුගාට්ටුප්පඩෛ, පොරුනරාට්ටුප්පඩෛ, සිරුපානාට්ටුප්පඩෛ, පෙරුම්පානාට්ටුප්පඩෛ, මුල්ලයිප්පාට්ටු, මදුරයික්කාංචි, නෙඩුනල්වාඩෛ, කුරුන්ජිජ්පාට්ටු, පට්ටිනප්පාඩෛල්, මලයිපඩුකඩාම්)
- පළමුවන සංගමයේ ප්‍රධාන කවියා අගත්තියර් මුනිවරයා යි. ඊට අමතරව මුරන්ජියූර්, මුඩිනාගරායර් යන කවීන් ද විය.
- තොල්කාප්පියර්, වල්ලුක්කාප්පියර් දෙවන සංගමයේ සිටි කවීන් දෙදෙනෙකි.
- තුන්වන සංගමයේ සිටි කවීන් තිදෙනෙක් වූයේ කබිලර්, පරකර්, නක්කිරාර් ය.
- සංගම් සාහිත්‍යයේ ඓතිහාසික හා සාහිත්‍යයික වටිනාකමක් මෙන් ම දේශපාලන (රජුගේ ස්වභාවය, රාජසභාව, ඔවුන්ගේ කාර්යයන්, රාජ්‍ය අතර ගැටුම්), ආර්ථික (කෘෂි කර්මාන්තය, වෙළෙඳාම, වෙළෙඳ ද්‍රව්‍ය, වෙළෙඳුන්, වෙළෙඳපොළ, වරායන්), ආගමික (දෙවිවරු, වන්දනා ක්‍රම), සමාජ හා සංස්කෘතික (එදිනෙදා ජීවිතය, සිරිත් විරිත්, ආහාරපාන) යන අංශ පිළිබඳ වැදගත් තොරතුරු රැසක් අන්තර්ගතව ඇත.
- දකුණේ තිබූ චේර, චෝල හා පාණ්ඩ්‍ය යන රාජ්‍ය ගැන තොරතුරු සඳහන් වේ.
- මේ රාජ්‍ය තුනේ සිටි ප්‍රබල රජුන් ලෙස චෝල රාජ්‍යයේ කරිකාලන්, චේර රාජ්‍යයේ සෙන්ගුට්ටුවන් හා පාණ්ඩ්‍ය රාජයේ නෙඩුඤ්ජේලියන් ය.

- කවීන්ට රජවරුන් අනුග්‍රහ දැක්විය. 500ට වැඩි කවීන් සිටි බව කියවේ. රජවරු පවා දක්ෂ කවීන් වූහ. කවීන් අතර විවිධ වෘත්තිකයන් ද විය, කාන්තාවන් ද විය.
- ස්වභාව ධර්මය කෙරෙහි අවධානය යොමුකර සහ ජනජීවිතය පදනම් කරගෙන බිහිවූ සාරවත් සාහිත්‍යයක් ලෙස සංගම් සාහිත්‍යය හැඳින්විය හැකිය.

**(ii) ක්‍රි. පූ. හයවැනි සියවසේදී ඉන්දියාවේ පැවති රාජාණ්ඩු**

- ක්‍රි. පූ. හයවැනි සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය පිළිබඳව තොරතුරු බෞද්ධ, ජෛන හා බ්‍රාහ්මණ ග්‍රන්ථවල සඳහන් වේ.
- ඒ අනුව ජනපද 16ක් පැවතිණි. (සොළොස් මහා ජනපද ලෙස හැඳින්වීම)
- සොළොස් මහා ජනපද තුළ ක්‍රියාත්මක වූ පාලන ක්‍රම දෙකකි. ඒ රාජාණ්ඩු පාලන ක්‍රමය හා සමූහාණ්ඩු පාලන ක්‍රමයයි.
- සොළොස් මහා ජනපද අතුරෙන් බහුතරයක් රාජාණ්ඩු වූ අතර ප්‍රධාන රාජාණ්ඩු හතරකි. ඒ මගධ, කෝසල, වත්ස හා අවන්ති ය. මේවා චතුර් මහා විජිතයන් ලෙස ද හැඳින්වේ.
- රාජාණ්ඩු පාලනයේ රජු ප්‍රධානියා විය.
- ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ යන අංශ තුනේම බලය රජුට හිමි විය.
- එහෙත් මන්ත්‍රී පර්ෂද මගින් රජුගේ බලය සීමාවිය.
- ඇත්, අශ්, රිය හා පාබල යන අංශවලින් යුක්ත හමුදාවක් සිටීම.
- මත්ස්‍ය න්‍යාය හා විවාහ සම්බන්ධතා මගින් ප්‍රධාන රාජ්‍ය හතර අනෙක් රාජ්‍ය යටත් කර ගනු ලැබීම.
- මේ රාජ්‍ය අතුරින් මගධය සියලු රාජ්‍ය අභිබවමින් ඉදිරියට පැමිණීම.
- එයට මගධයේ භූගෝලීය සාධක ද ඉවහල් විය.

**(iii).** මෞර්ය සහ ගුප්ත අධිරාජ්‍ය සමයන් අතර කාලයෙහි වයඹදිග ඉන්දියාවට එල්ල වූ විදේශීය ආක්‍රමණ.

- මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීමෙන් අනතුරුව සියවස් තුනක පමණ කාලයක් වයඹ දිග ඉන්දියාවේ කේන්ද්‍රාපසාරී බලවේග ක්‍රියාත්මක විය.
- ඉන්දු ග්‍රීක (යවන), පාර්තියන්වරු (පහ්ලව), ශක (සීතියන්වරු), කුෂාණවරු ආදි විදේශීය රාජ වංශ වරින් වර වයඹදිග දුර්ග හරහා පැමිණ බලය ව්‍යාප්ත කිරීම දක්නට ලැබේ.

**ඉන්දු ග්‍රීක (යවන)**

- මෞර්ය අධිරාජ්‍යය අවසාන කාලයේ සිට ග්‍රීකයන් වරින් වර ඉන්දියාවට පැමිණි අතර පශ්චාත් මෞර්ය යුගයේදී ඉන්දියාවේ පැවති දේශපාලන අස්ථාවරත්වය මත ඔවුන් ඉන්දියාව ආක්‍රමණය කිරීම.
- සිරියාවේ ඇන්ටියෝකස් රජු හින්දුකුස් කඳුවැටිය තරණය කර කාබුල් නිම්නයට ඇතුල් වී සුභගසේන රජුගෙන් කප්පම් ලෙස ඇත් හමුදාවක් ලබාගැනීම හා පංජාබය හා බටහිර ඉන්දියාවේ ප්‍රදේශ කීපයක් අල්ලා ගැනීම.
- ඩිමෙට්‍රියස් එල්ල කළ ආක්‍රමණයෙන් පංචාල හා සාගල අල්ලා ගැනීම.
- මිනැන්ඩර්ගේ ආක්‍රමණයෙන් ඉන්දියාවේ විශාල ප්‍රදේශයක් අත්පත් කරගැනීම. (මොහු සියල්කෝට් (සාගල, සාකල) අගනුවර කරගනිමින් ගංගා නම් නදියේ සිට ඔක්සස් නදී නිම්නය දක්වාත් හිමාලයේ සිට නර්මදා නදිය තෙක් ද බලය පැතිරවීම.

- මිනැන්ඩර්ගෙන් පසුව ග්‍රීක බලය පරිහානියට පත් වූ අතර එයින් පසු ග්‍රීක පාලකයන් වූයේ යුක්‍රාටිඩීස් හා හර්මයියෝස් ය. මිත්‍රඩේටස් නම් පාර්තීය රජු විසින් හර්මයියෝස් පරාජයට පත් කරන ලදී.
- මිනැන්ඩර් රජුට අයත් කාසි විශාල ප්‍රමාණයක් හමුවී තිබීම (තක්ෂිලා, පෙෂාවෝර්, රාවල්පිණ්ඩි).

**ශකවරු (සිතියන්වරු)**

- මධ්‍ය ආසියානු සංචාරක ගෝත්‍රයක් ලෙස සැලකෙන මොවුන් පිළිබඳ විස්තර ග්‍රීක, රෝම වාර්තාවලින් ද, චීන මූලාශ්‍රවලින් ද, මොවුන්ගේ සෙල්ලිපි හා කාසිවලින් ද හඳුනාගත හැකිවීම.
- බෝලාන් දුර්ගය හරහා ඉන්දියාවට පැමිණි මොවුන් ක්‍රි. පූ. පළමු හා දෙවන සියවස්වල වයඹදිග ඉන්දියාවේ බලය පැතිරවිය.
- ප්‍රථම පාලකයා ලෙස සැලකෙන මෝග (මාවුස්) රජු තක්ෂිලාව මුල්කොට ගෙන පාලනය ගෙන ගොස් ඇත (පංජාබය, ගාන්ධාරය, මථුරාව)
- ශකවරු සිය පාලන ප්‍රදේශය ක්ෂත්‍රප නම් ඒකකවලට බෙදා පාලනය කළහ.
- ශක පාලකයන් අතර බලවතෙකු වූ නහාපන මාල්වා දක්වා බලය පැතිරවිය.
- කර්දමක ශක පාලක චෂ්ටන සාතවාහන පාලකයන්ගෙන් ශක ප්‍රදේශ නිදහස් කරගනිමින් උජ්ජෙයිනිය අගනුවර කරගෙන පාලනය ගෙන යෑම.
- ශ්‍රේෂ්ඨතම රජු ලෙස සැලකෙන්නේ මහා ශත්‍රප රුද්‍රදාමන් රජුය. මොහු පිහිට වූ ජුනගාද් ලිපියට අනුව සාතවාහනයින් දෙවරක් ම පරාජය කර ඇති අතර මාල්වා, කතියවාර්, ගුජරාට, මාර්වාර්, උතුරු කොන්කානය හා ඉන්දු නිම්නය දක්වා බලය පතුරවා ඇත. ඔහුගෙන් පසු ශක පාලනය අවසන් විය.
- මොවුන් බටහිර ලෝකය සමග දියුණු වාණිජ සබඳතා පවත්වාගෙන ගොස් ඇත.
- **පාර්තීය (පහ්ලව)**
- වයඹදිග ඉන්දියාවේ බලවත්ව සිටි ශකවරු පරදවා තක්ෂිලාව මුල් කරගෙන රාජ්‍යයක් පිහිට වූයේ පාර්තියන්වරු ය.
- මිත්‍රඩේට්ස් ඉන්දු නිම්නය දක්වා බලය ව්‍යාප්ත කළේය.
- වයඹ දිග ඉන්දියාවේ බලය ව්‍යාප්ත කළ මුල් ම පාර්තීය පාලකයා වූයේ ගොණ්ඩොපර්නීස් රජු ය. මොහුගෙන් පසුව දුර්වල වූ පාර්තීය රාජ්‍යය කුෂාණයන් විසින් අල්ලා ගෙන ඇත.

**කුෂාණවරු**

- චින තුර්කිස්තානයේ සිට පැමිණි කුෂාණවරු යූ-ඒ-චී නම් එඬේර ගෝත්‍රයට අයත් ය.
- කුෂාණ ප්‍රථම පාලකයා කුජුල කැඩ්පයිසීස් වයඹ දිග ඉන්දියාව අල්ලා ගැනීම.
- වීම කැඩ්පයිසීස් තක්ෂිලා හා පංජාබය අයත් කර ගැනීම. කන්දහාර්, කාබුල්, මථුරා ප්‍රදේශවලින් ඔහු නිකුත් කළ කාසි ඊට සාක්ෂි වේ. මොහු සර්වලෝක ඊශ්වර, මහේශ්වර වැනි විරුද භාවිත කර ඇත.
- කුෂාණ රජුන් අතර ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස සැලකෙන්නේ කණිෂ්ක රජු ය. මොහු විසින් ගන්ධාරයේ පුරුෂපුරය (පෙෂාවෝර්) අගනුවර ලෙස තෝරා වයඹදිග ඉන්දියාවේ අධිරාජ්‍යයක් පිහිටු විය.
- මොහු විසින් අල්ලා ගත් ප්‍රදේශ ගැන කාසි හා අභිලේඛන සාක්ෂි ඇත. (කාශ්මීර, රාජ්පුතානා, මාල්වා, උත්තර ප්‍රදේශ, ශ්‍රාවස්ති, කතියවාර් ප්‍රදේශය යටත් කර ගැනීම.
- නැගෙනහිර ඉන්දියාවේ බෙංගාලය, ඔරිස්සා, බිහාර්, නේපාලය, බරණැස දක්වා සිය බලය ව්‍යාප්ත කිරීම,

- ඇෆ්ගනිස්ථානය හා මධ්‍ය ආසියාවේ යාර්ඛාන්ඩ්, කැෂ්ගාර්, ඛෝටාන් දක්වා බලය ව්‍යාප්ත කිරීම.
- බටහිර ඉන්දියාවට ද බලය ව්‍යාප්ත කර ඇත.
- කණිෂ්කගෙන් පසු රජ වූ පාලකයන් වූයේ වාශිෂ්ක, හුවිෂ්ක, වාසුදේව යන පාලකයන් ය.

**(iv) කුෂාණ යුගයේ සංස්කෘතිය**

- කුෂාණවරු විදේශ ජන කණ්ඩායමක් (චීන තුර්කිස්තානයේ සිට පැමිණි යූ-ඒ-චී නම් එඬේර ගෝත්‍රයට අයත් පිරිසක්ය) වුව ද පෙෂාවෝරය මුල් කරගනිමින් දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීම හා ආර්ථික වශයෙන් ඇති වූ දියුණුව සංස්කෘතිය කෙරෙහි බල පා ඇත.
- කුජුල කැඩ්පයිසීස්, විම කැඩ්පයිසීස් යන රජවරුන්ගෙන් පසු රජ වූ කණිෂ්ක රජතුමා කුෂාණ රජුන් අතර ශ්‍රේෂ්ඨතම පාලකයා වූ අතර ඔහුගේ අනුප්‍රාප්තිකයන් වූ වාශිෂ්ක, හුවිෂ්ක යන රජුන් ද සංස්කෘතිය වර්ධනයට අනුග්‍රහ දක්වා ඇත.
- කණිෂ්ක රජු සිව්වන ධර්ම සංගායනාව (මහායාන බුදුදහමේ ප්‍රගමනයට හේතු වූ) වසුමිත්‍ර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් හා අශ්වඝෝෂ, පාර්ශව, වසුබන්දු, සූර්යබන්දු, ජිනබන්දු වැනි මහතෙරුන් 500කගේ සහභාගිත්වයෙන් කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේදී පැවැත් විය.
- සංගායනාවෙන් පසු පාර්ශ්ව හිමිගේ අනුශාසකත්වයෙන් ත්‍රිපිටකයට විභාෂා ශාස්ත්‍ර නමින් අටුවා ග්‍රන්ථ රචනා වීම (විනය විභාෂා, සූත්‍ර විභාෂා, අභිධර්ම විභාෂා)
- මධ්‍යම හා නැගෙනහිර ආසියාතික රටවලට මහායාන ආගම ව්‍යාප්ත කිරීම (චීනය, ජපානය, කොරියාව)
- මධ්‍ය ආසියාවේ යාර්ඛාන්ඩ්, කැෂ්ගාර්, ඛෝටාන් වැනි ස්ථානවල බෞද්ධ මධ්‍යස්ථාන ඇතිවීම.
- ඉන්දියානු භාෂා ශාස්ත්‍රීය වර්ධනයක් ඇතිවීම. අශ්වඝෝෂ, වසුමිත්‍ර, පාර්ශව, නාගාර්ජුන වැනි උගතුන්ගේ ග්‍රන්ථකරණය නිසා බුද්ධ චරිතය, සූත්‍රාලංකාරය, ශාරිපුත්‍ර ප්‍රකරණය, සෞන්දරානන්ද කාව්‍යය වැනි ග්‍රන්ථ රැසක් බිහිවීම.
- චරක විසින් රචිත චරක සංහිතාව නම් විශිෂ්ඨ ආයුර්වේද ග්‍රන්ථය ද මේ අවධියේ රචනා වීම.
- නාට්‍ය රචනා වීම (ශුද්‍රකගේ මෘච්ඡකටිකා, භාසගේ ස්වප්නදත්තා)
- බෝධිසත්ව සංකල්පයේ වර්ධනයක් ඇතිවීම (බෝධිසත්වයානය) බෝධිසත්ව ප්‍රතිමා රැසක් ඉදිකිරීම.
- කලාව අතින් ගන්ධාර ප්‍රදේශය මුල් කරගත් ග්‍රීක ආභාසය සහිත කලා සම්ප්‍රදායක් හා මථුරා ප්‍රදේශය මුල් කරගත් දේශීය කලා සම්ප්‍රදායක් යන කලා සම්ප්‍රදායන් දෙකක් ඇතිවීම. මානවීය බුද්ධ ප්‍රතිමාකරණය ඇතිවීම නිසා බුදුපිළිම නිර්මාණයේ ආරම්භය සනිටුහන් වීම.
- බෞද්ධ ගොඩනැගිලි ඉදිකිරීම ( විහාරාරාම, ස්තූප, පේෂාවෝර් ධාතු මන්දිරය)
- කාසි අච්චු නිපදවීම.
- ක්‍රි. ව. 78 පාදක කරගෙන ශක රාජ වර්ෂ ක්‍රමය ආරම්භ කිරීම.
- වශිෂ්ක, හුවිෂ්ක යන රජවරුන්ද බුදුදහමේ දියුණුවට කටයුතු කර ඇත.
- බුදු දහම හා දියුණු විදේශ වෙළඳාමක් පැවතීම නිසා ඉන්දීය සංස්කෘතිය ඉන්දියාවෙන් ඔබ්බට ගමන් කිරීම.

***(ලකුණු 08 × 2 = 16යි.)***

## C කොටස

6. "සමුද්‍ර ගුප්ත යුද මෙහෙයුම් කරුවෙකි."

**(i) සමුද්‍රගුප්තගේ කාර්ය සාපල්‍ය ගැන තොරතුරු ලබාදෙන ප්‍රධාන මූලාශ්‍රය නම් කරන්න.**

හරිසේන කවියා විසින් රචිත අලහබාද් ප්‍රශස්තිය

***(ලකුණු 01යි.)***

**(ii) සමුද්‍රගුප්තට පූර්වයෙහි සිටි ගුප්ත පාලකයන් දෙදෙනකු නම් කරන්න.**

ශ්‍රී ගුප්ත/ ඝටෝත්කච ගුප්ත /පළමුවන චන්ද්‍රගුප්ත

***(ලකුණු 02යි.)***

**(iii) සමුද්‍රගුප්ත රජ වන විට ගුප්ත බලය පැතිරී තිබුණු ආකාරය පිළිබඳව කෙටි විස්තර කරන්න.**

- සමුද්‍රගුප්ත රජවීමට පෙර රජකම දැරූ ගුප්ත පාලකයන් වූයේ ශ්‍රී ගුප්ත, ඝටෝත්කච ගුප්ත හා පළමුවන චන්ද්‍රගුප්ත ය.
- ගුප්ත රාජ්‍යයේ ආරම්භක පාලකයා බෙංගාලයේ හෝ මගධයේ ප්‍රාදේශීය පාලකයෙක් ලෙස සිටි බව පුරාණ ග්‍රන්ථ හා ගුප්ත සෙල්ලිපි තුළින් පෙන්නුම් කෙරේ.
- පළමුවන චන්ද්‍රගුප්ත විසින් කුමාරදේවිය විවාහ කරගෙන ලිච්ඡවි ප්‍රදේශ ඈඳාගනු ලැබීමෙන් බල ප්‍රදේශය වර්ධනය විය.
- වින්සන්ට් ස්මිත්ට අනුව චන්ද්‍රගුප්තට මගධය හා ඒ අවට ප්‍රදේශවල ආධිපත්‍යය පැවති බව හා පාඨලිපුත්‍රය මේ වන විට ලිච්ඡවීන් සතුව පැවති නිසා එම නගරයත් විවාහය මගින් චන්ද්‍රගුප්තට හිමි වන්නට ඇති බව.
- "මහා රාජාධිරාජ" යන විරුදයෙන් පළමුවන චන්ද්‍රගුප්ත හැඳින්වීම හා රන්කාසි නිකුත් කිරීමෙන් පෙන්නුම් කෙරෙන්නේ රජුගේ බලය ස්ථාපිතව පැවති බවයි.
- පුරාණ ග්‍රන්ථ අනුව සාකේත (අවුද්), ප්‍රයාග (අලහාබාද්) හා මගධය ආශ්‍රිත ප්‍රදේශ ඔහු සතුව පැවතිණි.
- බිහාරය, උතුරු හා බටහිර බෙංගාලය ද චන්ද්‍රගුප්තගේ රාජධානියට අයත් ව තිබූ බව.
- මජුම්දාර් පවසන්නේ චන්ද්‍රගුප්ත සිතියන්වරුන් පලවා හැර මගධය නිදහස් කර ගත් බවයි.

***(ලකුණු 03යි.)***

**(iv) සමුද්‍රගුප්තගේ ව්‍යාප්තිවාදී ප්‍රතිපත්තිය ඇසුරින් ඔහු කෙතෙක් දුරට යුදකාමියකු ලෙස සැලකිය හැකිදැයි පරීක්ෂා කරන්න.**

- පළමුවන චන්ද්‍රගුප්තගේ හා ලිච්ඡවි වංශික කුමාරදේවියගේ පුත් සමුද්‍රගුප්ත පාඨලීපුත්‍රය මුල් කරගෙන ගුප්ත අධිරාජ්‍ය ගොඩනැගීම.
- සමුද්‍රගුප්තගේ ව්‍යාප්තිවාදී ප්‍රතිපත්තියේදී දිග්විජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීම.
- අධිරාජ්‍ය ව්‍යාප්තියට මුල් වූ යුධමය ක්‍රියාමාර්ග
  - ආර්යාවර්තය ජය ගැනීම.
    මෙහිදී නාගසේන, අච්‍යුතනාග, අච්‍යුත, චන්ද්‍රවර්මන්, රුද්‍රදේව, මතිලා, නාගදත්ත, නන්දින්, බලවර්මන් යන රජවරු 9 දෙනා පරාජය කොට එම රාජ්‍ය ඈඳා ගැනීම.
  - අටවික රාජ්‍යය යටත් කිරීම.
    මධ්‍යම ඉන්දියාව එනම් වින්ධ්‍යා කඳුවැටිය ආශ්‍රිත ප්‍රදේශවල රාජ්‍යයන්හි රජවරුන් පරාජයට පත් කොට ඔවුන්ගේ යටත්භාවය පමණක් ලබා ගැනීම.

- දක්ෂිණාපථ රාජ්‍යයන් ආක්‍රමණ.
දක්ෂිණාපථ රාජ්‍ය යටත් කොට ඒවායේ පාලකයන් අල්ලා ගත් අතර ඔවුන් රජුගේ ආධිපත්‍ය පිළිගත් යටත් පාලකයන් ලෙස නැවතත් එම රාජ්‍යවල පිහිටුවීම. (කෝසලයේ මහේන්ද්‍ර, මහාකාන්තාරයේ ව්‍යාඝ්‍රරාජ, කෞරාලයේ මන්ත්‍රරාජ, පිෂ්ඨපුරයේ මහේන්ද්‍ර, කොට්ටූරයේ ස්වාමිදත්ත, එරණ්ඩපල්ලයේ දමන, කාංචියේ විෂ්ණුගෝප, අවමුක්තයේ නීලරාජ, වෙංගියේ හස්ථිවර්මන්, පල්ලක්කයේ උග්‍රසේන, දේවරාෂ්ට්‍රයේ කුබේර, කුෂ්තලපුරයේ ධනංජය)
- ප්‍රත්‍යන්ත රාජ්‍ය යටත් කිරීම.
සමතට (බෙංගාලය අවට), දවාක (ඇසෑම් ප්‍රදේශ), නේපාලය, කාමරූප (ඉහළ ඇසෑමය),
කත්‍රිපුර (ජලන්දාර්)
- සංඝ රාජ්‍ය යටත් කිරීම.
සංඝ රාජ්‍ය නවයක් යටත් කරගෙන තිබේ. (මාලව, ආර්ජුනායන, යෞධෙය, මද්‍රක, ආභීර, ප්‍රාර්ජුන, සනකානික, කාක, ඛරපරික)
- ප්‍රත්‍යන්ත රාජ්‍ය හා සංඝ රාජ්‍යවල පාලකයෝ බදු ගෙවීම, ගුප්ත රාජ්‍යයේ නියෝග පිළිපැදීම හා තෑගිභෝග හා විවිධ දැකුම් සමඟ රජු බැහැදැක යටත් බව ප්‍රකාශ කිරීම මගින් රජුගේ ආධිපත්‍යය පිළිගෙන ඇත.
- දිග්විජය අවසානයේ අශ්වමේධ යාග දෙකක් පැවැත්වීමෙන් ද සමුද්‍රගුප්තගේ අධිරාජ්‍ය ව්‍යාප්තිය යුධමය කාර්යයක් බව පැහැදිලි ය.
- මූලාශ්‍ර අනුව රජු යුද්ධ කර විශාල ප්‍රදේශයක් අල්ලා ගත් බව පැහැදිලි වන නමුත් වෙනත් තොරතුරු අල්ප ය.

***(ලකුණු 10යි.)***

**7. හර්ෂවර්ධනගේ මරණයෙන් පසු උතුරු ඉන්දියාවේ ආධිපත්‍ය උදෙසා පැවති අරගලය පරීක්ෂා කරන්න.**

- හර්ෂවර්ධන රජුගේ මරණයෙන් පසු උතුරු ඉන්දියාවේ ආධිපත්‍ය උදෙසා ප්‍රධාන වශයෙන් රාජවංශ තුනක් අතර බල අරගල ඇතිවීම. (ත්‍රිකෝණ අරගලය)
- බටහිර ඉන්දියාවේ රාජපුතානාහි ගුර්ජර ප්‍රතිහාර, බෙංගාලයේ පාල හා බටහිර ඩෙකානයේ මහාරාෂ්ට්‍රයේ රාෂ්ට්‍රකූට යන රාජ්‍ය තුන අතර ගැටීම.
- හර්ෂවර්ධන රාජ්‍ය සමයේදී උතුරු ඉන්දියාවේ බල කේන්ද්‍රස්ථානය බවට කනෞජය පත්වීම නිසා මේ රාජ්‍යයන් කනෞජයේ ආධිපත්‍යය වෙනුවෙන් යුද්ධ කරන ලද්දේ කනෞජය දිනාගැනීමටය. එය උතුරු ඉන්දීය දේශපාලන ආධිපත්‍යයේ සංකේතයක් බවට පත්වී තිබීම.
- රාෂ්ටකූට පාලක ධ්‍රැව රජු ගුර්ජර ප්‍රතිහාර පාලක වත්සරාජ හා ඔහුගේ සේනාව පරාජය කොට රාජපුතානා කාන්තාරය දෙසට පලවා හැරීම.
- රාෂ්ටකූට පාලක ධ්‍රැව බෙංගාලය ආක්‍රමණය කොට ධර්මපාල රජු පරාජය කළ ද ධ්‍රැවට හදිසියේ ආපසු යෑමට සිදුවීමෙන් කනෞජය අල්ලාගත් ධර්මපාල රජු ප්‍රතිහාරයන්ට යටත්ව සිටි ඉන්ද්‍රායුධ ඉවත් කොට තමාට අවනත චක්‍රායුධ එහි පාලකයා බවට පත් කිරීම.
- ගුර්ජර ප්‍රතිහාර පාලක දෙවන නාගභට (වත්සරාජගේ පුත්‍රයා) ප්‍රතිහාර බලය නැවත පිහිටුවීමට දැරූ උත්සාහයේදී ධර්මපාල රජු පරාජය කිරීම.
- එහෙත් රාෂ්ටකූට පාලක තුන්වන ගෝවින්ද උතුරු ප්‍රදේශය ආක්‍රමණය කොට නාගභට පරාජය කිරීම සමත් විය. නමුත් ජයග්‍රහණය තහවුරු කර ගැනීමට පෙර ගෝවින්ද රජුට ආපසු යෑමට සිදුවීම නිසා එය ධර්මපාල රජුට වාසිදායක වීම.
- ධර්මපාල රජුගේ පුත් දේවපාල රජු ද උතුරු ඉන්දියාවේ බලය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.

- ගුර්ජර ප්‍රතිහාර පාලක භෝජ රජු ද සටන් ගෙන යමින් උතුරු ඉන්දියාවේ අධිරාජ්‍ය බලය අල්ලා ගැනීමට ක්‍රියා කිරීම
- අවසානයේදී මෙම රාජ්‍ය තුනම දුර්වල වී ඒවායේ බලය වෙනත් කණ්ඩායම් දිනා ගැනීම.

*(ලකුණු 16යි.)*

8. දකුණු ඉන්දියානු දේශපාලනයෙහිලා චෝළයන්ගේ දායකත්වය පහත දැක්වෙන ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.

**(i)** අධිරාජ්‍ය ව්‍යාප්තිය

- ක්‍රි. ව. 9 වන සියවසේ පාණ්ඩ්‍යයන් යටතේ පැවති තන්ජෝරය අල්ලාගත් විජයාලය චෝල

අධිරාජ්‍ය සඳහා පදනම සකස් කිරීම.

- විජයාලයගෙන් ආරම්භ වී පළමුවන ආදිත්‍ය, පරන්තක, පළමුවන රාජරාජ, පළමුවන රාජේන්ද්‍ර යන රජුන් යටතේ බලය වර්ධනය වීම.
- විජයාලයගේ පුත් පළමුවන ආදිත්‍ය තොණ්ඩෙයි මණ්ඩලම්හි ආධිපත්‍යය හිමි කරගෙන, කොංගු දේශය, බටහිර ගංගයින්ගේ අගනුවර වූ තලකාඩ් අල්ලාගෙන බලගතු රාජ්‍යයක් බවට පත් කිරීම.
- පරන්තක විසින් පාණ්ඩ්‍ය බලය බිඳදැමීම හා රාෂ්ට්‍රකූටයන් පරාජය කිරීම මගින් චෝල රාජ්‍යය ස්ථාවර කිරීමට සමත් වුව ද රාෂ්ට්‍රකූට පාලක තුන්වන කෘෂ්ණ හා කළ තක්කෝලම් සටනින් චෝළයින් පරාජය වී බලව්‍යාප්තිය තාවකාලිකව නතරවීම.
- මෙයින් පසු චෝල අධිරාජ්‍යය පළමුවන රාජරාජ යටතේ ගොඩනැගීම.
- රාජරාජ විසින් චෝළ නාවික බලය වර්ධනය කර ගැනීම තුළින් ත්‍රිවන්ද්‍රම්හිදි (කාන්දලූර්) කේරළ නාවික හමුදාව විනාශ කිරීම.
- කේරළ හා පාණ්ඩ්‍ය බලය මර්ධනය කර දැමීම.
- අනුරාධපුරය ආක්‍රමණය උතුරු ප්‍රදේශය අල්ලා ගැනීම. (පස්වන මිහිඳු රෝහණයට පලා යෑම)
- බටහිර ගංග රටේ පාලන ප්‍රදේශ තුනක් වූ ගංගවාඩිය, තංගවාඩිය හා කෝළම්බවාඩිය ජය ගැනීම.
- සිහසුන සඳහා අරගලයක් පැවති නැගෙනහිර චාලුක්‍ය අගනුවර (වෙංගි) අල්ලාගෙන, තම ආධිපත්‍යය පිළිගත් ශක්තිවර්මන්ට රජකම ලබාදීම.
- ශක්තිවර්මන් රජුගේ සහෝදරයා වූ විමලාත්‍යයට තම දියණිය (කුන්දවා කුමරිය) සරණ පාවාදීම.
- කාලිංගය ජය ගැනීම.
- මාලදිවයින් (දූපත් දොළොස් දාහ) අල්ලා ගැනීම.
- රාජ රාජ දකුණු ඉන්දියාවේ බිහි වූ ශ්‍රේෂ්ඨතම පාලකයන් අතර කෙනෙකි.
- පළමුවන රාජේන්ද්‍ර රජු විසින් මෙහෙය වන සටන් හා ඔහු ලැබූ ජයග්‍රහණ පිළිබඳ විස්තර ඔහුගේ අභිලේඛන වන තිරුවාලංගාඩු තඹ සන්නසේ හා තිරුමලෙයි ගිරි ලිපියේ සඳහන් වේ.
- තුංගභද්‍රා නදියෙන් උතුරු සටන් මෙහෙයවා බෙංගාලයේ ගංගානම් නදිය දක්වා ජයග්‍රාහි ලෙස සටන් මෙහෙය වීම.
- බටහිර චාලුක්‍ය ජයසිංහ පරාජය කිරීම.
- පාණ්ඩ්‍ය හා කේරල ප්‍රදේශ යටත් කරගෙන පාලකයන් ලෙස පුතුන් පත් කිරීම.
- ක්‍රි. ව. 1017 දී ලංකාව ආක්‍රමණය කර උතුරු ප්‍රදේශයේ බලය හිමි කර ගැනීම හා පස්වන මිහිඳු රජු සිරකරුවෙකු ලෙස රැගෙන යෑම,

- ➢ පොලොන්නරුව පාලන මධ්‍යස්ථානය කර ගනිමින් එය ජනනාථමංගලම් නමින් ද එම ප්‍රදේශය මුම්මුඩිශෝල මණ්ඩලම් නමින් හඳුන්වමින් ප්‍රාන්තයක් ලෙස පවත්වා ගෙන යෑම.
- ➢ අග්නිදිග ආසියාවට ආක්‍රමණ එල්ල කරමින් පළමුවෙන් අන්දමන් හා නිකෝබාර් දූපත් අවනත කර ගැනීම.
- ➢ ශ්‍රී විජය රාජ්‍යයට ආක්‍රමණයක් එල්ල කරමින් ශෛලෙන්ද්‍ර රජු පරාජය කොට කඩාරම් බලකොටුව අල්ලා ගැනීම. (කඩාරම් කොණ්ඩ යන විරුද නාමයෙන් හැඳින්වීම)
- ➢ මෙම ආක්‍රමණ සමඟම සුමාත්‍රා, ජාවා, මලයානු අර්ධද්වීපය හා පහළ බුරුමය ද සිය අවනතභාවයට පත් කරගෙන චෝල බලය අග්නිදිග ආසියාවට ව්‍යාප්ත කිරීම.
- ➢ නව අදහසක් වන්නේ අග්නිදිග ආසියාවේ රටවල්හි දේශපාලන ආධිපත්‍යයක් නොව වෙළෙඳ ආධිපත්‍යයක් හිමි කරගත් බව යි.
- ➢ මේ මඟින් ඉන්දියන් සාගරයේ හා අග්නිදිග ආසියාකරයේ වෙළෙඳාම පාලනය කිරීමට සමත්වීම.

(ii) **ප්‍රාදේශීය හා ග්‍රාමීය පරිපාලනය**

චෝල පාලනය රජු වටා සංවිධානය වූ රාජාණ්ඩු ක්‍රමයක් වූ අතර පරිපාලනය මධ්‍ය පාලනය, ප්‍රාදේශීය පාලනය හා ග්‍රාම පාලනය වශයෙන් ප්‍රධාන අංශ තුනක් යටතේ සකස් වී පැවතිණි.

**ප්‍රාදේශීය පරිපාලනය**

- ප්‍රාදේශීය පාලනයේදී චෝළ අධිරාජ්‍යය මණ්ඩලවලට බෙදා තිබිණි.
- එවැනි මණ්ඩල ගණන ඇතැම් විට 6ක් වූ අතර ඇතැම් විට 8ක් ද වී ඇත. චෝළ අධිරාජ්‍යය ඉතා විශාල අවධියේදී මණ්ඩල ගණන 9ක් විය. (පාණ්ඩ්‍ය මණ්ඩලම්, චෝළ මණ්ඩලම්, මලයිනාඩු මණ්ඩලම්, කොංගු මණ්ඩලම්, මුම්මුඩිචෝල මණ්ඩලම්)
- චෝළ මණ්ඩලම් හැර අනෙකුත් මණ්ඩලම් පාලනය කරන ලද ප්‍රාදේශීය පාලකයන් ලෙස බොහෝදුරට කටයුතු කළේ රාජකුමාරවරුන්, රජපවුලේ පිරිස් ය.
- මණ්ඩලම්හි පාලකයන්ට යුධ හමුදාවක් සිටීම.
- මණ්ඩලම් නැවත වලනාඩු, නාඩු, කුර්රම්, මෙලාගම් නම් කොටස්වලට බෙදා තිබීම.
- කන්යූර් හෙවත් කන්කුරම් නගර පාලන ඒකක විය.

**ග්‍රාම පරිපාලනය**

- චෝළ පාලනයේ ඉතා වැදගත් පාලන ඒකකය වූයේ ගමයි.
- ග්‍රාම පාලනයේදී "ඌර් " සහ " සභා " නමින් ආයතන දෙකක් විය.
- ගම් කීහිපයක් එකතු කර " මහසභාව " සකස් විය.
- නිලධාරීන් තෝරා ගනු ලබන්නේ ගමක් කොටස් තිහකට බෙදා එහි සුදුසුකම් ලද්දන් අතුරින් කුසපත් ඇදීමේ ක්‍රමයටය.
- උත්තරමේරූ ශිලාලිපියෙන් ග්‍රාම පාලනය පිළිබඳ වැදගත් තොරතුරු හමුවේ.
- ගම් පාලනය සඳහා ග්‍රාමකේය, මුක්ත, ග්‍රාම මණ්ඩල, වාරියම් නමින් හැඳින්වෙන කාරක සභා පැවතිණි.
- මහාසභාව වාරියම් නමින් හැඳින්වෙන කාරක සභාවලට (කම්ටු) බෙදා ඒවාට සේවාවන් පවරා ඇත.

- උත්තරමේරු ශිලාලිපියට අනුව එහි වාරියම් 5කට බෙදා තිබිණි. (ගෙවතු පිළිබඳ කමිටුව, වාරිමාර්ග කමිටුව, වාර්ෂික කමිටුව, රන් කමිටුව, පංචවාර කමිටුව)
- මහසභාව මගින් ගම වෙනුවෙන් විශාල වගකීම් කොටසක් ඉටුකිරීමට බැඳී සිටි. (ඉඩම් වගා කරවීම, ජලසම්පාදනය, සෞඛ්‍ය කටයුතු, මාර්ග ඉදිකිරීම, අධ්‍යාපනය, ආගමික කටයුතු, බදු එකතු කිරීම, නඩු විසඳීම)
- ගම්සභාව සතු වගකීම් හා බලතල ක්‍රියාත්මක කිරීමේදී කමිටුවල සහයට වැටුප් ලබන ස්ථිර නිලධාරී පිරිසක් විය.
- ගම්සභා පාලනය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මකවීම නිසා මධ්‍යම ආණ්ඩුවේ බලය දුර්වල වුවත් ගම්සභා පාලනය හොඳින් පැවතීම විශේෂ ලක්ෂණයකි.

***(ලකුණු 16යි.)***

**9. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.**

**(i) ගුප්ත පාලකයන් යටතේ සාහිත්‍යය**

- ගුප්ත යුගයේ පැවති ආර්ථික සමෘද්ධියත් රාජානුග්‍රහයත් සාහිත්‍යයේ වර්ධනයට හේතු විය.
- සමුද්‍රගුප්ත, දෙවන චන්ද්‍රගුප්ත යන රජවරු පවා මනා අධ්‍යාපනයක් ලැබූ පාලකයෝය.
- මෙකල සංස්කෘත භාෂාව සාහිත්‍යමය භාෂාවක් වශයෙන් උපරිම දියුණුවක් ලැබීම.
- සංස්කෘත ව්‍යාකරණය ක්‍රමානුකූල තත්ත්වයට පත් විය. පාණිනි හා පතඤ්ජලී යන ආචාර්යවරු මෙහිලා මුල් තැනක් ගත්හ.
- සංස්කෘත සාහිත්‍යයේ ස්වර්ණමය යුගයක් ලෙස ගුප්ත යුගය සැලකේ.
- නාට්‍ය, ඡන්දස්, අලංකාර, ගණිතය (අංක ගණිතය, වීජ ගණිතය, ජ්‍යාමිතිය, ශුද්ධ ගණිතය) විද්‍යාව, තර්ක ශාස්ත්‍රය, තර්ක න්‍යාය, වෛද්‍ය ශාස්ත්‍රය, නීතිය, තාරකා විද්‍යාව, ආගම, දර්ශනය ආදි විවිධ ක්ෂේත්‍ර අළලා ගද්‍ය, පද්‍ය රැසක් රචනා කර ඇත.
- මෙකල උගතුන් රැසක් බිහිවිය.

| | |
|---|---|
| කාලිදාසගේ කාව්‍ය | රඝුවංශය, කුමාරසම්භවය, මේඝදූතය, ඍතුසංහාරය |
| කාලිදාසගේ නාට්‍ය | මාලවිකාග්නිමිත්‍ර, ශාකුන්තලය |
| විශාඛදත්තගේ නාට්‍ය | මුද්‍රා රාක්ෂය, දේවිචන්ද්‍රගුප්ත |
| භාරවීගේ මහා කාව්‍ය | කිරාතාර්ජුන, ශිශුපාලවධ |
| අමරසිංහගේ | අමරකෝෂ (සංස්කෘත භාෂාවේ ශබ්ද කෝෂයකි). |
| වරාහමිහිරගේ | බෘහත් සංහිතාව |
| ආර්යභටගේ | සූර්ය සිද්ධාන්තය, ආර්යභට්ටිය |
| බ්‍රහ්මගුප්ත | බ්‍රාහ්ම ස්ඵුටික සිද්ධාන්ත |
| වෘහද් වාග්භට | අෂ්ටාංගෘදය |

- අලහාබාද් ප්‍රශස්තිය සමුද්‍රගුප්ත රජුගේ රජවාසලේ කවියෙකු හරිසේන විසින් කරවන ලද්දකි.
- ධර්මශාස්ත්‍ර ග්‍රන්ථ රචනාවීම. (කාත්‍යායනගේ ධර්ම සූත්‍රය) මේවා නම් කර ඇත්තේ කතුවරුන්ගේ හෝ ගුරුකුලවල නම් මුල් කරගෙනය.
- හිංදු ආගමේ ඇති වූ ප්‍රබෝධය ආගමික සාහිත්‍යයේ වර්ධනයට හේතු විය.
- ත්‍රිමූර්තිය පදනම් කොට ගත් හින්දු ආගම ක්‍රමවත්ව සංවිධානය විය.
- මෙකල නව නිර්මාණ හැර පැරණි ග්‍රන්ථ ද නව මුහුණුවරකින් රචනා විය..
- මහාභාරතය, රාමායණය වර්තමානයේ පවතින තත්ත්වයට සකස් විය.
- පුරාණ ග්‍රන්ථ, මනුස්මෘතිය ද මෙලෙසද සකස් විය.

- පංචතන්ත්‍රය හා හිතෝපදේශ මේ අවධියේදී සම්පාදනය විය.
- ගුප්ත රජවාසලේ නවරත්න කවීන් සේවය කළේය.
- මෙකල උසස් අධ්‍යාපනයක් ලබාගැනීමට හැකිවීම ද සාහිත්‍යයේ වර්ධනයට හේතු විය. (නාලන්දා විශ්වවිද්‍යාලය)

**(ii) හූණ ආක්‍රමණ**

- මධ්‍ය ආසියාවේ සිටි ම්ලේච්ඡ ගෝත්‍රයක් ලෙස හඳුන්වන හූණයෝ අවස්ථා කීපයකදීම ඉන්දියාව ආක්‍රමණය කළහ.
- ක්‍රි.ව. 5 සියවස මැද භාගයේදී ප්‍රථම වරට හූණයින් ගන්ධාර අල්ලාගෙන නැගෙනහිර දෙසට ව්‍යාප්ත විය.
- ස්කන්ධගුප්ත විසින් මෙම ආක්‍රමණය මැඩපැවැත් විය. (භිතරි ලිපිය)
- නරසිංහ ගුප්ත රජුගේ කාලයේ හූණ ආක්‍රමණිකයන්ගේ දරුණු ප්‍රහාරවලට ලක් වූ අතර කප්පම් ගෙවූ බව ද සඳහන්වේ. (හියුං - ත්සාංගේ වාර්තාව)
- ක්‍රි. ව. 6 වැනි සියවස ආරම්භයේදී තෝරමාන යටතේ හූණවරු පංජාබය හරහා ඉන්දියාවේ අභ්‍යන්තරයට කඩා වැදිණි.
- ඔහු නිකුත් කළ කාසි උත්තර ප්‍රදේශ්, රාජපුතානා, පංජාබ් හා කාශ්මීරය යන ප්‍රදේශවලින් හමුවේ.
- ක්‍රි. ව. 515 දී තෝරමානගේ පුත් මිහිරකුල සිය අගනුවර ලෙස සියල්කෝට් හෙවත් සාගල තෝරා ගෙන ඇත.
- දරුණු රජෙකු වූ මොහු අමානුෂික ලෙස ක්‍රියා කළ බව රාජතරංගනිය, හියුං - ත්සාංගේ වාර්තාව, සුංග් - යුන්ගේ වාර්තාවේ සඳහන් වේ.
- මිහිරකුල එරාන් දක්වා උතුරු ඉන්දියාව ආක්‍රමණය කළ අවස්ථාවේ භානුගුප්ත රජුගේ ප්‍රහාරවලින් පරාජයට පත් විය.
- මැන්ඩසෝරයේ යසෝවර්මන් හූණ බල ව්‍යාප්තිය මැඩ පැවැත්වීම නිසා හූණ බලය වයඹ දිග ඉන්දියාවට සීමා විය.
- කන්‍යාකුබ්ජයේ මෞඛරි වංශික ඊසානවර්මන්ගේ පුත් සර්වවර්මන් රජු හූණයින් සමඟ සටන් කොට පරදවා හූණ ආක්‍රමණවලින් උතුරු ඉන්දියාව බේරා ගෙන ඇත.
- ගුප්ත අධිරාජ්‍යයේ පරිහානියට හූණ ආක්‍රමණ බෙහෙවින් ම බල පෑවේය.

**(iii) හර්ෂවර්ධන රජු**

- ථානේශ්වරයේ පුෂ්‍යභූති රාජවංශයට අයත් හර්ෂවර්ධන රජු දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික ක්ෂෙත්‍ර දියුණු කළ පාලකයෙකි.
- රජු ගැන තොරතුරු සපයන ප්‍රධාන මූලාශ්‍රය භාණබට්ටගේ හර්ෂචරිතයයි.
- ගුප්ත යුගයෙන් පසු උතුරු ඉන්දියාව එක්සත් කළ අවසාන හින්දු පාලකයාය.
- බල ව්‍යාප්තියේදී දිග්විජය ව්‍යාපාරය අනුගමනය කළේය.
- ගෞඩදේශයේ සසංකට විරුද්ධව හමුදාව මෙහෙය විය.
- තම සොහොයුරිය රාජ්‍ය ශ්‍රී කුමරිය සෙවීම සඳහා වින්ධ්‍යව තෙක් ගිය ගමනේදී පසු කළ රාජ්‍යයන්හි පාලකයන් යටත් රජුන් බවට ද එම රාජ්‍යයන් අවනත රාජ්‍යයන් බවට ද පත් කර ගත්තේය.
- වලභි හා ගුර්ජර පාලකයන්ට විරුද්ධව සටන් කළේය.
- චාලුක්‍ය වංශික දෙවන පුලකේෂින්ට විරුද්ධව සටන් කළේය.
- සින්ධු ප්‍රදේශය ආක්‍රමණය කළේය.
- බෙංගාලය, අවුද්, කොංගෝදා, ඔරිස්සා ඇතුළත් නැගෙනහිර ආක්‍රමණය කළේය.
- කනෞජය මුල් කරගෙන පාලන කටයුතු මෙහෙය විය.

- ➢ සකල උත්තරාපථනාථ නමින් රජු හඳුන්වා ඇත.
- ➢ බුද්ධාගමට හා වෙනත් ආගමික නිකායන්ගේ වර්ධනයට අනුග්‍රහ දක්විය.
- ➢ ස්තූප, විහාර ඉදිකිරීම.
- ➢ ආගමික සම්මේලන පැවැත්වීම. (කනෞජ් හා ප්‍රයාග සම්මේලනය)
- ➢ ප්‍රයාගවල මෝක්ෂද් පර්ෂද නම් පංච වාර්ෂික මහාදානය පැවැත්විය.
- ➢ උගතුන්ට හා බුද්ධිමතුන්ට අනුග්‍රහ දක්විය.
- ➢ ආදායමෙන් ¼ ක් ලේඛකයන්ට පිරිනැමීය.
- ➢ නාලන්දා, වලභි, තක්ෂලා වැනි අධ්‍යාපන ආයතනවලට අනුග්‍රහ දක්වීය.
- ➢ රජුද ග්‍රන්ථකරණයේ යෙදීම. (රත්නාවලි, ප්‍රියදර්ශිකා, නාගානන්ද)
- ➢ හර්ෂචරිතය, කාදම්බරි වැනි කෘති බිහිවිය. (භාණබට්ට රචිත)

## (iv) පාණ්ඩ්‍ය රාජධානිය

- ➢ ක්‍රිෂ්ණ නදියෙන් දකුණු ප්‍රදේශයේ ආදිතම කාලයේ පටන් (සංගම් යුගයේදී ද) පැවති රාජධානියකි.
- ➢ පාණ්ඩ්‍යයන් පිළිබඳ තොරතුරු මහාවංසය, සංගම් සාහිත්‍ය, මෙගස්තිනීස් වාර්තා, කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය, අශෝක ලිපි, පාණ්ඩ්‍ය ලේඛනවලින් (වෙල්වකුඩි ලේඛනය, සින්නමනූර් ලේඛනය, ජම්බුකේශ්වර දේවාල ලිපිය, කුඩුමියාමලෙයි ප්‍රශස්තිය) හමුවේ.
- ➢ පාණ්ඩ්‍යයන් අවස්ථා දෙකකදී දේශපාලන බලවතුන් බවට පත් විය.
- ➢ එනම් ක්‍රි. ව. 670-920 කාලයේදී ප්‍රථම පාණ්ඩ්‍ය අධිරාජ්‍යය පැවතීම හා ක්‍රි. ව. 1216-1310 කාලයේදී දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යය පැවතීම.
- ➢ පාණ්ඩ්‍යයන්ගේ අගනුවර මධුරාපුරයයි.
- ➢ පාණ්ඩයන් යටතේ බලසම්පන්න රාජ්‍යයක් ගොඩනැගීමට පදනම සකස් කරන ලද්දේ කඩුන්ගොන් රජුය.
- ➢ මාරවර්මන් අවනිශිලාමණි, ශෙන්දන්, අරිකේශරි මාරවර්මන්, කොච්චඩයියන් (රණධීර), පළමුවන රාජසිංහවර්මන් යන පාලකයෝ පාණ්ඩ්‍ය බලය රැකගනිමින් ස්ථාවර තත්ත්වයකට ගෙන ආහ.
- ➢ පාණ්ඩ්‍ය රාජ්‍යය අධිරාජ්‍යය තත්ත්වයකට ගෙන ඒමට කටයුතු කළේ පළමුවන වරගුණවර්මන් රජතුමා ය. (ජටිල පරාන්තක)
- ➢ මොහු යටතේ පාණ්ඩ්‍ය ආධිපත්‍යය තංජෝරය හා කොයිම්බතෝර් ප්‍රදේශවල ව්‍යාප්ත විය.
- ➢ ශ්‍රී මාර ශ්‍රී වල්ලභ පාණ්ඩ්‍ය ආධිපත්‍යය දකුණු ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත කිරීමට උත්සාහ දැරීම. (පළමුවන සේන රජ සමයේ ලංකාව ආක්‍රමණය කර අනුරාධපුරය කොල්ලකෑම)
- ➢ ශ්‍රී මාර ශ්‍රී වල්ලභ පරාජය කර ඔහු පුත් දෙවන වරගුණවර්මන් සිහසුන ලබා ගැනීම. (සිංහල සේනාවගේ ආධාර ඇතිව - දෙවන සේන රජු කුට්ඨා නම් සෙනෙවි යටතේ මධුරාවට යැවූ සේනාව )
- ➢ පල්ලව, චෝළ, ගංගයන්ගේ ඒකාබද්ධ ප්‍රහාරයෙන් සිදු වූ ශ්‍රී පුරම්බියම් සටනින් පාණ්ඩ්‍ය බලය දුර්වල විය.
- ➢ ඔහුගේ ඇවෑමෙන් පරන්තන වීරනාරායන බලයට පත් වූ අතර මෙකල පාණ්ඩ්‍යයන් අභිබවා චෝළයින් බලවත් වෙමින් සිටීම.
- ➢ පරන්තනට පසු සිහසුනට පත් වන්නේ දෙවන රාජසිංහ මාරවර්මන් ය.
- ➢ දෙවන රාජසිංහ මාරවර්මන් ලංකාවේ ආධාර ඇතිව (පස්වන කාශ්‍යප රජු සක්ක සේනාපති යටතේ යැවූ සේනාව) චෝළ පාලකයා වූ පරන්තක සමඟ සිදු කළ වෙල්ලූර් සටනින් පරාජය වීම නිසා තවදුරටත් පාණ්ඩ්‍ය බලය දුර්වල විය.
- ➢ පාණ්ඩ්‍ය රජු ජීවිත ආරක්ෂාව පතා රාජකකුධ භාණ්ඩ ද රැගෙන ලංකාවට පැමිණ රාජකකුධ භාණ්ඩ සිංහල රජු වෙත තබා සිය මව විසූ කේරළයට යෑම.

- චෝළයින් දකුණේ බලවතුන් බවට පත්විය.
- මින් පසු සියවස් දෙකක් පමණ කාලයක් පාණ්ඩ්‍ය දේශය චෝළ අධිරාජ්‍යයේ ප්‍රාන්තයක් ලෙස පැවතිණි.
- ක්‍රි. ව. 12 වන සියවස අවසාන කාලයේදී පමණ (1173) චෝළ රාජ්‍යයේ ඇති වූ සිවිල් අරගල නිමාවන්නේ පාණ්ඩ්‍යයන් දෙවන වරට දකුණේ බලවතුන් බවට පත් වෙමිනි.
- ජටාවර්මන් කුලසේකර, පළමුවන මාරවර්මන් සුන්දර පාණ්ඩ්‍ය යන රජවරු චෝළ බල ප්‍රදේශ අල්ලා ගත්හ.
- දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යය කූටප්‍රාප්ත වන්නේ 1251 බලයට පත් වූ ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය යටතේ ය.
- 1253 - 54 කාලයේදී සිංහාසනයට පත් වූ ජටාවර්මන් වීරපාණ්ඩ්‍ය රජු ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය සමඟ එකතුවී දකුණු ඉන්දියාවේ විශාල ප්‍රදේශයක පාණ්ඩ්‍ය බලය ව්‍යාප්තිය කළහ
- කේරළ රාජ්‍යය ආක්‍රමණය කර කප්පම් ගෙවන තත්ත්වයට පත් කිරීම. හොයිසාලයන්ගේ බලය සීමා කිරීම, කොන්ගු රාජ්‍යය හා කාංචිපුර අල්ලා ගත්හ.
- ලංකාව ජයගත් බව ඔවුන්ගේ සෙල්ලිපිවල සඳහන් කර ඇත.
- පළමුවන මාරවර්මන් කුලසේකර රජ දවස ආර්යචක්‍රවර්ති නම් සෙන්පතියා ලංකාව ආක්‍රමණය කර යාපහුවේ තැන්පත් කර තිබූ දළදා වහන්සේ පාණ්ඩ්‍ය දේශයට රැගෙන ගියේය.
- මුස්ලිම් ආක්‍රමණ හේතු කරගෙන පාණ්ඩ්‍ය බලය පරිහානියට පත් විය.

***(ලකුණු 08 x 2 = 16යි.)***

******